# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 91 — 1973 දෙසැම්බර් 21 වැනි සිකුරාද — 1973.12.21

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (IIඅ) වැනි ඡේදය—පලකිරීම්

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)



| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1801 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1817 |



සැලකිය යුතුයි.—(1) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 47 දරණ මුදල් පනත, (2) 1973 අංක 48 දරන ජාතික ලේඛනාරක්ෂක පනත, (3) 1973 අංක 49 දරන නිවාස සංවර්ධකයන්ගේ (විශේෂ විධිවිධාන) පනත, (4) 1973 අංක 50 දරන ලංකා ඛනිජ තෙල් සංස්ථා (සංශෝධන) පනත, (5) 1973 අංක 51 දරන ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතන (සංශෝධන) පනත, (6) 1973 අංක 52 දරන ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම පිළිබඳ (සංශෝධන) පනත, (7) 1973 අංක 53 දරන කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත හා 1973 අංක 54 දරන රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගම් (සංශෝධන) පනත යන පනත් දෙසැම්බර් මස 21 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයන් වශයෙන් පළවේ.

## තනතුරු—ඇබෑර්තු

### ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයෙහි පළ කරවනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**1. අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම්**

1 : 1 තමා ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම් කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

"ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම ලැබුවෙකි.

1 : 2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම් කරුවකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙක් වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල භාෂාව විෂයයෙන් සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත්, රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

1 : 3 නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් අසමත්වීම හේතු කොට ගෙන පරිවාස/පරීක්ෂණ කාලය සහිත සේවය අවසන් කරනු ලැබූ "නව ප්‍රවේශක" රජයේ නිලධාරීන් ව සිටි අය, අංක 640 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව අදළ තනතුරට හෝ සේවයට නියමිත වූ ඉහළම සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් වීමට හිමිකම් ලබන අන්දමේ සුදුසුකම් ලබා ගෙන සිටියොත් මිස, එසේ නොමැති නම්, ඔවුන් ගෙන් ලැබෙන අයදුම් පත් භාරගනු නො ලැබේ.

**2. දීමනා**

2 : 1 ඒ ඒ තනතුරට අදාළ මාසික ඒකාබද්ධ වැටුපට අතිරේක වශයෙන්, රාජ්‍ය සේවයෙහි නියුක්ත මාසික වැටුප් ලබන සියලුම විවාහක නිලධාරීන්ට ආයතන සංග්‍රහයේ, VIII වැනි පරිච්ඡේදයෙහි 1 වැනි වගන්තියෙහි දක්වා ඇති පදනම මත විවාහක දීමනා වක් ගෙවනු ඇත.

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

**විශේෂ නිවේදනයයි**

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් භාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

---

1801—B 71141 — 15,145 (73/12)

B 1 9

2 : 2 (සියලුම දීමනාවන් ද ඇතුලුව) රු. 180 සිට රු. 250 දක්වා මාසික වැටුප්/වේතන ලබන ගණයට අයත් රාජ්‍ය නිලධාරීන්ට මාසික වශයෙන් රු. 7.50 ක විශේෂ දීමනාවක් ගෙවනු ඇත. අවශ්‍ය තැන මෙම දීමනාව ක්‍රමික කිරීමට ඉඩ ඇත.

### 3. සේවා කොන්දේසි : සාමාන්‍ය

3 : 1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි, වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තාහ.

3 : 2 අදාල අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලෙස රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥා පනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

3 : 3 දිවයිනෙහි ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැක.

### 4. ස්ථිර පත්වීම් දරණ රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

4 : 1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 3 වැනි වගන්තියෙහි සඳහන් කොන්දේසි වලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලටද යටත් විය යුත්තාහ :—

4 : 1 : 1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතුයැයි සලකනු ලබන්නේ නම් විනා, එසේ නොමැති නම්, සියලුම පත් කිරීම් අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ, හේතුවක් නොදක්වා සේවය කෙළවර කරනු ලැබිය හැකිය.

4 : 1 : 2 රාජ්‍ය සේවයෙහි “ නව ප්‍රවේශකයන් ” වන සියලුම රාජ්‍ය නිලධාරීහු, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවන් සඳහා, 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතෙහි විධි විධානවලටත්, රාජ්‍යයෙහි භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දනට ක්‍රියාත්මකව පවත්නාවූත්, අනාගතයේදී පනවනු ලැබිය හැකි වූත් නීති සහ ව්‍යවස්ථා වෙතොත්, ඒවාටත් අනුකූල විය යුත්තාහ.

4 : 1 : 3 රාජ්‍ය භාෂාවෙන් වැඩ කිරීමට හැකි වන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබා ගන්නා ලෙස සියලුම රාජ්‍ය නිලධාරීන්ට නියම කෙරේ.

4 : 1 : 4 පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත් වීමත්, අවුරුදු දෙකක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි II වැනි ශ්‍රේණියෙන් සමත් වීමත්, (අවශ්‍ය නම්) අවුරුදු තුනක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි III වැනි ශ්‍රේණියෙන් සමත් වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාලසීමාව ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයන් තාවකාලිකව අත්හිටවනු ලැබිය හැකිය. නියමිත කාල සීමාව ඉක්මී තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත් වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත් හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත් වන තෙක් හෝ පහත දක්වෙන 4 : 1 : 5 වැනි වගන්තියෙහි විධි විධානයන් බලපවත් වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේ ය.

4 : 1 : 5 පරිවාස කාල සීමාව අවසානයේදී සිංහල ප්‍රවීනතාවය පිළිබඳ නියමිත තත්වයට පැමිණීමට නොහැකි වුවහොත්, එහි ලා ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයෙහි 12 : 13 වැනි වගන්තියෙහි විධි විධානයන් ක්‍රියාත්මක වනු ඇත.

4 : 1 : 6 සිංහල මාධ්‍යයෙන් සේවයට බඳවා ගනු ලැබූ අය විෂයෙහි 4 : 1 : 3, 4 : 1 : 4, සහ 4 : 1 : 5 වැනි වගන්ති අදාල නොවන්නේ ය.

4 : 1 : 7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු, රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාල සීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැක.

4 : 1 : 8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද, වෛද්‍ය පරීක්ෂණයට භාජන කරනු ලැබුවා වූද අය හැර) තෝරා ගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනෙහි ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත් වන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

### 5. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

5 : 1 1972. 01. 01 වැනි දිනට පසු, ස්ථිර සේවයට අයත් තනතුරුවලට හෝ තාවකාලික සේවයට අයත් මාසික වැටුප් සහිත තනතුරුවලට හෝ (දෛනික වැටුප් රේට් ප්‍රමාණයන් ගෙවනු ලබන—සේවකයන් හැරයි) පත් කරනු ලබන සියලුම රාජ්‍ය නිලධාරීන් විසින් තමන්ගේ ඒකාබද්ධ වැටුපෙන් 6% ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී ගෙවා ඇති ඒකාබද්ධ වැටුපෙන් සියයට 9% ක් රජය විසින් එම අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවනු ඇත. එබඳු තනතුරක් දරන්නකුට (කැමති නම්) තමාගේ මනාපය පරිදි තම මාසික ඒකාබද්ධ වැටුපෙන් තව 6%ක් දක්වා වූ ස්වේච්ඡා දායක මුදලක් එම අරමුදලට ගෙවිය හැක. එහෙත් එම දායක මුදල වෙනුවෙන් රජය විසින් දායක මුදලක් නොගෙවනු ඇත.

5 : 2 1971. 12. 31 වැනි දිනට පෙර රාජ්‍ය සේවයෙහි ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරු දරමින් සිටි රාජ්‍ය නිලධාරීන්, 1972. 01. 01 වැනි දිනට පසු, රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරකට පත් කරනු ලැබුවහොත්, එම තනතුර දරන නිලධාරියාට පමණක් පෞද්ගලික වූවක් වශයෙන් යථෝක්ත විශ්‍රාම වැටුප් හිමිකම නොකඩවා භුක්ති විඳීමට ඉඩදෙනු ඇත. එම රාජ්‍ය නිලධාරියා පෙර පරිදිම වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වනු ඇත.

### 6. යුද්ධ සේවා අනුග්‍රහය

6 : 1 එක්සත් රාජ්‍යයේ යුද්ධාව තීර්ණ හමුදාවන්හි සේවා මුක්ත භටයන්ටද සහාය හිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජනාරක්ෂක සේවාවන්හි පූර්ණ කාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිට තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්වී නොගිය අයට ද ඉහත කී සියලුම සුදුසුකම් තිබේනම්ද, ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතු නම්ද, ඔවුන්ගේ එම සේවය සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතික් සුදුසුකම් ලබා

ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින්, 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තමතමන් සේවය කළ කාලයන් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**7. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

7 : 1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලුම සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නාවූද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූද, නිලධාරීන්ගෙන් යමකු නව තනතුරට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකිද නොහැකිද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

7 : 2 නියමිත වේලාවක නියමිත ස්ථානයකදී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

7 : 3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව අයථා අනුග්‍රහයක් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සෙකු කරනු ලැබීමට හේතුවනු ඇත.

7 : 4 අයදුම්කරුවකුගේ අයදුම් පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

7 : 5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**8. සුදුසුකම පිළිබඳ අවශ්‍යතාව සඳහා වැටුප යන්නෙහි අර්ථ දැක්වීම**

8 : 1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

---

## ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

### සහකාර ලේඛනාරක්ෂක තනතුර

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ සහකාර ලේඛනාරක්ෂක තනතුර සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම ගැසට් නිවේදනය සමග පලවන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කළ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ, අංක 212 දරණ ස්ථානයේ පිහිටි සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1974 ජනවාරි මස 25 දින.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1974 ජනවාරි මස 25 දින.

**සටහන්.**—(i) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේදී නැති බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින් විඳ දරාගත යුතුය.

(ii) පිට රටවල අයදුම්කරුවන්ට තම ඉල්ලුම් පත්‍ර සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළතදී බාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iii) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ශ්‍රී ලංකා ජනරජය යටතේ සේවය සඳහා පත්කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන් ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා සේවා කොන්දේසි :**

(i) තනතුර ස්ථිරය. පත්වීම අර්ථසාධක අරමුදල් පදනමක් මත වනු ඇත. තෝරාගනු ලබන අයදුම්කරු විසින් ඔහුගේ ඒකාබද්ධ වැටුපෙන් සියයට හයක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට තැන්පත් කළ යුතු අතර, රජය විසින් ඔහුගේ ඒකාබද්ධ වැටුපෙන් සියයට නවයක් තැන්පත් කරනු ලැබේ. අයදුම්කරු දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත නිලධාරියෙකු නම් ඔහුගේ විශ්‍රාම වැටුප් හිමිකම් නවදුරටත් භුක්ති විඳිනු ඇත.

(ii) (අ) තෝරාගනු ලබන අයදුම්කරු තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව පත්කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුක්ත අයදුම්කරුවෙකු තෝරාගතහොත් ඔහු නිශ්චිත කාලයකට වැඩ බැලීමේ පදනමක් මත පත් කරනු ලැබේ.

(ආ) තෝරාගනු ලබන රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් ප්‍රථමයෙන් එක් අවුරුදු වැඩ බැලීමේ කාලයක් මත පත්කරනු ලබන අතර, එම වැඩ බැලීමේ කාලය තුළ නිලධාරියා සුදුසු බවක් පෑයේ නම් තනතුරෙහි ස්ථිර කරනු ලබන අතර, වැඩ බැලීමේ කාලය තුළ ඔහු නුසුදුස්සෙකු බව පෑයේ නම්, ඔහු කලින් දැරූ තනතුරට පමුණුවනු ලැබේ.

(ඇ) පරිවාස කාලය තුළදී නිලධාරියා විසින් ලේඛන පරිපාලනය පිළිබඳ පුහුණුවක්ද, දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නියම කරනු ලබන පරිදි 17 වන ශත වර්ෂයේ ඕලන්ද භාෂාව හෝ මධ්‍ය කාලීන පෘතුගීසි භාෂාව පිළිබඳ දැනීමක්ද ලබාගත යුතුය.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේය.—වර්ෂයකට රු. 6,720 න් පටන්ගෙන රු. 360 වාර්ෂික වැඩිවීම් 12 ක් මගින් රු. 11,040 ක වාර්ෂික වැටුප තෙක් වැඩිවෙන ඒකාබද්ධ වැටුප් ක්‍රමයකි.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ට චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(බී) 1974.01.25 දිනට වයස අවුරුදු 30 කට නොවැඩි බව. (රජයේ සේවයේ නියුක්ත වූවන් කෙරෙහි මෙම වයස් සීමාව අදාල නොවේ.)

(සී) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉතිහාසය, භාෂා, නීතිය හෝ විද්‍යාව පිළිබඳ විෂයයන්ගෙන් පළමුවැනි පෙළ හෝ දෙවෙනි පෙළ ගෞරව උපාධියක් ලබා සිටින්නෙකු බව,

(ඩී) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මනා ප්‍රවීණත්වයක් ලබා ඇති බව.

**සටහන.**—(අ) සිංහල හෝ දෙමළ පිළිබඳ හොඳ දැනීමක් සහ පෘතුගීසි හෝ ලන්දේසි භාෂා පිළිබඳ දැනීම අමතර සුදුසුකමක් වශයෙන් සලකනු ලැබේ.

(ආ) අවසාන පරීක්ෂණයේදී රසායන විද්‍යාව විෂයයක් වශයෙන් ගෙන ඇති විද්‍යා උපාධිධාරීන්ට විශේෂයක් දක්වනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (**සැ. යු.**—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන වයස් සහතික හෝ බව්තීස්ම සහතික බාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ විද්‍යාලීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සැ. යු.**—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුයි.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධයෙන් අනෙක් ලියකියවිලි සියල්ලක්ම සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම්ට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. ඉල්ලුම් පත්‍ර පෝරමය මේ කාර්යාලයට ලැබුණු බව දන්වනු ලැබේ. ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තමන්ගේ ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දන්වීමක් නොලැබෙන්නාවූ අයදුම්කරුවන් විසින් ඒ බව වහාම සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්ට දැනුම්දිය යුතුයි. මේ විධානය ඉටුකිරීම පැහැර හැරියොත් අයදුම්කරුවෙකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ගෝමසිරි ප්‍රේමවර්ධන,
සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
අංක 212, බෞද්ධාලෝක මාවත,
කොළඹ 7,
1973 දෙසැම්බර් මස 06 දින.

### ආදර්ශ අයදුම් පත්‍රය

සහකාර ලේඛනාරක්ෂක තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය

**ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව**

අංකය :
(කාර්යාල ප්‍රයෝජනය සඳහා)

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ලිපිනය :————.

3. (අ) උපන් දිනය :—අවු.———, මාස ———, දින :———.
   (ආ) ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස :—අවු :——— මාස :———, දින :————.

4. ජාතිය :————.
   (අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකුවූයේ පරම්පරාවෙන් ද? නැතහොත් ලියාපදිංචි වීමෙන් ද? (ඔබ ලංකාවේ පුරවැසියෙකුව් සිටින්නේ ලියාපදිංචිවීමෙන් නම් ලියාපදිංචි සහතිකයේ යොමු අංකය හා දිනය සඳහන් කරන්න.)

5. උපන් ස්ථානය :————.
   (අ) අයදුම්කරුගේ :————.
   (ආ) පියාගේ :————.
   (ඇ) පියපස මුත්තාගේ :————.
   (ඈ) පියපස මී මුත්තාගේ :————.

(අයදුම්කරු ශ්‍රී ලංකාවේ උපන්නෙක් නම් "අ" වලට අමතරව "ආ" හෝ "ඇ" සහ "ඈ" පිරවිය යුතුය. ඔහු/ඇ උපන්නේ ශ්‍රී ලංකාවේ නොවේ නම් "අ" වලට අමතරව "ආ" සහ "ඇ" හෝ "ඈ" සම්පූර්ණ කළ යුතුය.)

6. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :————.
   (ආ) අයදුම්කරු විවාහකද? අවිවාහකද? වැන්දඹුද යන වග : ————.

7. අධ්‍යාපන සහ අනිකුත් සුදුසුකම් :————.
   (අ) සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :————.

| ආයතනයේ නම | දිනය | විෂයයන් හා ලබාගත් පන්තිය |
|---|---|---|
| 1. සිංහල | | |
| 2. දෙමළ | | |
| 3. ඉංග්‍රීසි | | |

   (ආ) අධ්‍යාපනය ලැබූ පාසැල්, විද්‍යාල හා වෙනත් ආයතන :————.

| ආයතනයේ නම | සිට | දක්වා | ලබාගත් පුහුණුවේ ස්වභාවය හෝ සමත් වූ විභාගය |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |

8. (අ) ඔබ ණයගැති භාවයෙන් මිදී සිටින්නේද? ණයගැතිව සිටී නම් ඒ කොපමණකටද?
   (ආ) ඔබ කිසියම් සාපරාධී වරදකට උසාවියකින් දඬුවම් ලබා ඇත්ද? එසේ නම් දිනය, නඩු අංකය සමග සම්පූර්ණ විස්තර සඳහන් කරන්න.

9. දැනට කරන රැකියාව හා ඊට ප්‍රථමයෙන් කරන ලද රැකියාවක් වේනොත් ඒවා පිළිබඳ විස්තර :————.

| සේවායාගේ නම සහ ලිපිනය | දරූ පදවිය | සිට | දක්වා | වැටුප |
|---|---|---|---|---|
| 1. | | | | |
| 2. | | | | |
| 3. | | | | |

10. ඔබ ගැන තොරතුරු විමසිය හැකි ඔබ ගැන හොඳින් දන්නා හඳුනන (නෑදැයින් නොවන) පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සඳහන් කරන්න.
   1. ————
   2. ————

11. තනතුරු සඳහා අවශ්‍ය විශේෂ සුදුසුකම් හෝ පළපුරුදුකම් ආදියක් ලබා තිබේ නම් ඒවා :————.

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදිවූත්, ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරාගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, තෝරා ගැනීමට පසු දැනගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9-623—73.12.21 දින අංක 91 දරණ ගැසට් පත්‍රය

---

### ශ්‍රී ලංකා යුද හමුදා දෙපාර්තමේන්තුව

පුද්ගලික සහකාර තනතුර (සිවිල්)

ශ්‍රී ලංකා යුද හමුදාධිපති යටතේ පුද්ගලික සහකාර තනතුරක් සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. අයදුම්කරුගේ අත් අකුරින් ම පිළියෙල කරන ලද අයදුම් පත්, පහත සඳහන් ආකෘති පත්‍රය ප්‍රකාර විය යුතුය. අයදුම්පත්, කොළඹ 3, තැ. පෙ. 553, යුද හමුදා මූලස්ථානයේ **සිවිල් පාලන නිළධාරි වෙත,** 1974.01.23 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

2. **වැටුප් පරිමාණය.**—වර්ෂයකට රු. 6,240—7×180—රු. 7,500 (ඒකාබද්ධ)

3. **වයස් සීමාව.**—වයස අවුරුදු 23 ට නොඅඩු හෝ අවුරුදු 40 ට නොවැඩි විය යුතුය. දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයදුම් කරුවන්ට වැඩි වයස් සීමාව බලපාන්නේ නැත.

4. **අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම්.**—(i) සෑම අයදුම්කරුවෙකු විසින්ම තමා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඒ හා සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත් වී ඇති බවට පිළිගත හැකි සාධක ඉදිරිපත් කළ යුතුය.

(ii) අයදුම්කරුවන් සට ඉංග්‍රීසි ලඝු ලේඛනය පිළිබඳව විනාඩියකට වචන 120 කට නොඅඩු වේගයකින් තිබිය යුතු අතර, විනාඩියකට වචන 40 කට නොඅඩු වේගයකින් ටයිප් කිරීමට හැකියාවක් තිබිය යුතුය. (සිංහල ලඝු ලේඛනය හා යතුරු ලියනය ගැන දැනීමකින් යුතු අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)

(iii) ලේඛන කටයුතු පිළිබඳව පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(iv) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා හොඳ ශාරීරික සනීපයෙන් යුතු අය විය යුතුය.

5. **බඳවා ගැනීමේ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. පත්වීම අර්ථසාධක අරමුදල් පදනමක් මත වනු ඇත. 1971.12.31 වැනි දින විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරූ යම්කිසි පුද්ගලයෙකු මෙම තනතුර සඳහා පත් කරන්නට යෙදෙන අවස්ථාවක් වේනොත්, නවදුරටත් ඔහුගේ විශ්‍රාම වැටුප් හිමිකම් භුක්ති විඳීම 71.12.24 දිනැති අංක 42 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ අඩංගු නිර්ණයන්ට යටත් වනු ඇත.

තෝරාගනු ලබන අයදුම්කරු 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන වලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා සියළු නීතිරීති හා ව්‍යවස්ථා වලටත්, මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත්. එකඟව කටයුතු කිරීමේ කොන්දේසි පිළිගත යුතුය.

6. **සේවයේ කොන්දේසි.**—මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වන ඡේදයේ ආරම්භයේ පලකර තිබෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් පිළිබඳ පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

7. අයදුම්කරුවන් විසින් තමන්ගේ අයදුම් පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුය.

(i) උප්පැන්න සහතිකය (බෞතිස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා රීති සංග්‍රහයේ කාර්යය සඳහා නිකුත් කරනු ලැබූ සහතික හෝ භාරගනු නොලැබේ.)

(ii) ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතික හා අංක 4 (II) හා (III) යන ඡේදවල සඳහන් සුදුසුකම් පිළිබඳ සහතික.

(iii) අයදුම්කරුගේ චරිතය හා සුදුසුකම් පිළිබඳව ලබාගන්නා ලද සහතික දෙකක් (දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් විසින් එවැනි සහතික ඉදිරිපත් කිරීම අනවශ්‍යය.)

**සැලකිය යුතුයි.**—සහතික පත්‍රවල හා චරිත සහතික වල පිටපත් ආපසු එවනු නොලැබේ.

8. රාජ්‍ය සේවයෙහි නියුක්ත නිලධාරීන්ගේ අයදුම් පත් ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් අයදුම් පත් ඉදිරිපත් කිරීමේ දී, කෙටි දැන්වීමකින් පසු අයදුම්කරු පත්වීම භාර ගැනීම සඳහා සේවයෙන් නිදහස් කළහැකිදැයි සඳහන් කළ යුතුයි.

9. කොළඹ දී පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකට සහ විභාගය කට ඉදිරිපත් වීම සඳහා අයදුම්කරුවන් සූදානම් වී සිටිය යුතුය. මේ සඳහා ගමන් වියදම් ගෙවනු නොලැබේ.

අමරසිරි නානායක්කාර,
සිවිල් පාලන නිලධාරී—යුද හමුදාව.

1973 දෙසැම්බර් මස 8 වැනි දින,
යුද හමුදා මූලස්ථානය.
තැ. පෙ. 553,
කොළඹ 3.

**පුද්ගලික සහකාර තනතුර සඳහා අයදුම් පත්‍රය**

1. සම්පූර්ණ නම :————.
   (අ) අගට යෙදෙන නම :————.
   (ආ) අනික් නම් :————.
2. ලිපිනය :————.
3. ජාතිය හා ජාතිකත්වය ලැබූ පිළිවෙල :————.
4. (අ) උපන් දිනය හා ස්ථානය :————.
   (ආ) 1974.1.23 දිනට නියම වයස :————.
5. ස්ත්‍රී පුරුෂ භාවය :————.
6. විවාහක ද නැතහොත් අවිවාහක ද යන වග :————.
7. ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් :————.
8. පළපුරුද්ද පිළිබඳ විස්තර (දැන්වීමේ 4 (II) හා (III) ඡේද බලන්න) :————.
9. දැනට කරන රක්ෂාව (ඇතොත්) :————.
10. චරිත සහතික ලබාගත් දෙදෙනාගේ නම් සහ තනතුරු :————.
11. විශේෂ සුදුසුකම්, හිමිකම් ආදිය ඇත්නම් ඒ පිළිබඳ විස්තර : ————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12-703—73.12.21 දින අංක 91 දරණ ගැසට් පත්‍රය

---

**අධ්‍යාපන දෙපාර්තමේන්තුව—කෑගල්ල**

කෑගල්ල, කණිෂ්ඨ කාර්මික ආයතනයේ, බාහිර උපදේශක හා බාහිර ශිල්ප ප්‍රදර්ශක තනතුරු—1974 අධ්‍යයන වර්ෂය

කෑගල්ලේ, කණිෂ්ඨ කාර්මික ආයතනයේ පහත සඳහන් විෂයයන් ඉගැන්වීම සඳහා බාහිර උපදේශකවරුන් හා බාහිර ශිල්ප ප්‍රදර්ශකවරුන් වශයෙන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් හා ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය ප්‍රකාර සකස් කර ගත් අයදුම්පත්, 1973 දෙසැම්බර් මස 31 දින හෝ ඊට පෙර "විද්‍යාලයාධිපති, කණිෂ්ඨ කාර්මික ආයතනය, කෑගල්ල" යන ලිපිනයට ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් පත් ලැබුනු බව දන්වනු නොලැබේ.

**බාහිර උපදේශකවරුන් සහ අදාල විෂයයන් :**

| | |
|---|---|
| (1) සිංහල භාෂාව | සිංහල මාධ්‍යය |
| (2) වාණිජ අංක ගණිතය | |
| (3) ගණකාධිකරණය | |
| (4) වාණිජ්‍ය හා මුදල් | |
| (5) වීජ ගණිතය ඇතුළු වාණිජ ගණිතය | |
| (6) සමාජ අධ්‍යයනය | |
| (7) විකුණුම් ශාස්ත්‍රය හා විකුණුම් පාලනය | |
| (8) පිරිවැය ක්‍රම | |
| (9) ආර්ථික විද්‍යාව ඇතුළු සාමාන්‍ය වාණිජ දැනුම | |
| (10) ගණිතය | |
| (11) ව්‍යවහාරික යන්ත්‍ර විද්‍යාව | |
| (12) තාප යන්ත්‍ර | |
| (13) යන්ත්‍ර ඇඳීම | |
| (14) ජ්‍යාමිතික හා යාන්ත්‍රික ඇඳීම | |
| (15) ජ්‍යාමිතික ඇඳීම | |
| (16) ද්‍රව්‍ය හා ව්‍යුහ | |
| (17) විදුලි කාර්මික විද්‍යාව | |
| (18) භෞතික විද්‍යාව | |
| (19) විදුලි කම්බි සවිකිරීම (න්‍යාය) | |
| (20) විදුලි කම්බි සවිකිරීමේ (ප්‍රායෝගික) | |
| (21) ගුවන් විදුලි යන්ත්‍ර සේවා කිරීම (න්‍යාය) | |
| (22) ගුවන් විදුලි යන්ත්‍ර සේවා කිරීම (ප්‍රායෝගික) | |
| (23) ඉංග්‍රීසි භාෂාව | |

**බාහිර ශිල්ප ප්‍රදර්ශකවරුන් සඳහා අදාල විෂයයන්**

| | |
|---|---|
| (1) ලෝහ වැඩ | සිංහල මාධ්‍යය |
| (2) විදුලි ශිල්පය | |

2. බාහිර උපදේශකවරුන්ට හා බාහිර ශිල්ප ප්‍රදර්ශකවරුන්ට වර්ෂයාවසානය දක්වා පමණක් වේ. අවශ්‍යතාවේ ප්‍රකාර ඊට කලින් පංතිය අනුව පැයකට රු. 5 සිට රු. 10 දක්වා වෙනස්වනු ඇත.

3. මෙම තනතුරු 1974 වර්ෂයේ ජනවාරි මස පටන්ගෙන වර්ෂයාවසානය දක්වා පමණක් වේ. අවශ්‍යතාවේ ප්‍රකාර ඊට කලින් වුවද අවසන් කෙරෙනු ඇත.

4. ආයතනයේ පංති පැවැත්වෙනුයේ පෙ. ව. 8 සිට ප. ව. 6.30 දක්වා වේ. මෙම කාලය තුලදී තමන්ට පංති ගැනීමට පහසු වේලාව අයදුම්පත්හි සඳහන් කල යුතුය. එක් එක් විෂය සඳහා වෙන වෙනම අයදුම්පත් එවිය යුතුය. මෙම තනතුරු සඳහා තෝරා ගැනීමේ දී කෑගල්ල අවට පදිංචිකරුවන් ගැන විශේෂයෙන් සලකා බලනු ඇත.

5. බාහිර උපදේශකවරුන් විසින් මධ්‍ය වාර්ෂික පරීක්ෂණයන්හිදී සහ බාහිර පරීක්ෂකයින් නොයදවන වාර්ෂයාවසාන පරීක්ෂණයන් හිදී ද අමතර ගාස්තුවක් නොමැතිව තමන්ගේ පංතිවල සිසුන් පරීක්ෂා කිරීම කළ යුතුය.

6. රාජ්‍ය සේවාවෙහි යෙදී සිටින අයදුම්කරුවන් නම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කල යුතුය. ඊට පටහැනිව හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවන අයදුම්පත් යම්හෙයකින් ප්‍රමාදවනු ලැබුවහොත් අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත කලට වේලාවට ලැබී ඇති බවට හා ප්‍රමාදය ගැන සෑහෙන හේතූන් සමග ඉදිරිපත් කරනු ලබන අයදුම් පත්‍ර පමණක් බාරගනු ලැබේ.

7. අයදුම්කරුවන් අතුරින් වැඩිම සුදුසුකම් ලබා ගන්නා අයදුම් කරුවන් මෙම තනතුරු සඳහා පත්කිරීම කෙරෙන අතර, පත්කිරීම පිළිබඳ අවසාන තීරණය මා සතුය. කිසිම අයදුම් පත්‍රයක් මෙම

කාර්යාලයට හෝ මෙම කාර්යාලයේ හෝ කෑගල්ල කණිෂ්ඨ කාර්මික ආයතනයේ හෝ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික ලිපිනයට නොඑවිය යුතුය.

ඩී. බී. මල්ලිකාරච්චි,
කෑගල්ලේ, ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1973 දෙසැම්බර් මස 08 දින,
කෑගල්ලේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

ආදර්ශ ආකෘතිය

**කෑගල්ල, කණිෂ්ඨ කාර්මික ආයතනයේ ...................... විෂයය පිළිබඳ ...................... තනතුර සඳහා අයදුම් පත්‍රය**

(1) සම්පූර්ණ නම :————.

(2) පෞද්ගලික ලිපිනය :————.

(3) සේවා ස්ථානයේ ලිපිනය :————.

(4) වයස :————.

(5) දැනට දරන තනතුර :————.

(6) (i) දැනට සේවය කරන දෙපාර්තමේන්තුව හෝ ව්‍යාපාරයේ නම :————.

(ii) ප්‍රාදේශීය කාර්යාලය (අදාලනම් පමණි) :————.

(7) අධ්‍යාපනික සුදුසුකම් :————.

(8) වෘත්තීය සුදුසුකම් :————.

(9) ඉගැන්වීමේ පළපුරුද්ද :————.

(10) බාහිර උපදේශකවරයෙකු වශයෙන්/බාහිර ශිල්ප ප්‍රදර්ශකවරයෙකු වශයෙන් ඉගැන්වීමට බලාපොරොත්තු වන විෂයය :————.

(11) පංති ගැනීමට හැකි කාල පරිච්ඡේදය :————.

(12) සතියක් තුලදී පංති ගැනීමට හැකි උපරිම පැය ගණන :——.

ඉහත සඳහන් කරුණු සත්‍ය හා නිවරද බව සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12–659—73.12.21 දින අංක 91 දරණ ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය

### ඇබෑර්තු

ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයේ පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. තම නම සහ ලිපිනය ලියන ලද මුද්දර කවරයක් එවීමෙන් ලබා ගන්නා ඉල්ලුම්පත්‍ර මගින් අයදුම් කළයුතුය.

**කෘෂිකාර්මික සහකාර—VII වැනි ශ්‍රේණිය**

**වේතන පරිමාණය.**—රු. 350—15×20—රු. 650 සියලු දීමනා අඩංගුව මසකට.

**සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ සමාන සහතිකයක් සමග කුණ්ඩසාලේ ගොවිකම් පාසැලේ හෝ සමාන පිළිගත් ආයතනයක දෑවුරුදු ඩිප්ලෝමා සහතිකයක් තිබිය යුතුය. (සහතිකවල පිටපත් ඉල්ලුම් පත්‍රය සමග එවිය යුතුය.)

තෝරාගනු ලබන අයදුම්කරුවන් දෙවසරක පුහුණුවීමේ කාලයක් මත තබනු ලබන අතර, එම කාල පරිච්ඡේදය තුල ඔවුන්ට රු. 350ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ. සතුටුදායක ලෙස පුහුණුවීමේ කාලය සම්පූර්ණ කළ පසු ඔවුන් රු. 350—15×20—රු. 650 ක් වන සියලු දීමනා අඩංගු මාසික වැටුප් පරිමාණයට පත්කරනු ලැබේ.

තෝරාගනු ලබන අයදුම්කරුවන් පුහුණුවීමේ කාලය සතුටුදායක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසු යටත් පිරිසෙයින් අවුරුදු පහක් සංයුක්ත මණ්ඩලයේ සේවය කරන බවට සංයුක්ත මණ්ඩලය සමග ගිවිසුමකට එළඹිය යුතුය.

**කෘෂිකාර්මික සහකාර—VIII වැනි ශ්‍රේණිය**

**වේතන පරිමාණය.**—රු. 250—17×15—රු. 505 සියලු දීමනා අඩංගුව මසකට.

**සුදුසුකම්.**—රසායන විද්‍යාව සහ ජීව විද්‍යාව හෝ උද්භිද විද්‍යාව හෝ සත්ව විද්‍යාව යන විෂයයන් වලට සම්මාන සාමාර්ථයක් සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ සමාන සහතිකයක් සමග එක් අවුරුදු ප්‍රායෝගික ගොවිපල් පාසලක සහතිකයක් සහ පිළිගත් රජයේ හෝ පුද්ගලික කෘෂිකාර්මික ආයතනයක ප්‍රායෝගික කෘෂිකර්මය පිළිබඳ වර්ෂයක පළපුරුද්දක් තිබිය යුතුය. (සහතිකවල පිටපත් ඉල්ලුම් පත්‍රය සමග එවිය යුතුය.)

තෝරාගනු ලබන අයදුම්කරුවන් දෙවසරක පුහුණුවීමේ කාලයක් මත තබනු ලබන අතර, එම කාල පරිච්ඡේදය තුළ ඔවුන්ට රු. 250ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ. සතුටුදායක ලෙස පුහුණුවීමේ කාලය සම්පූර්ණ කළපසු ඔවුන් රු. 250—17×15—රු. 505 ක් වන සියලු දීමනා අඩංගුව මාසික වැටුප් ප්‍රමාණයට පත් කරනු ලැබේ.

තෝරාගනු ලබන අයදුම්කරුවන් පුහුණුවීමේ කාලය සතුටුදායක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසු යටත් පිරිසෙයින් අවුරුදු පහක් සංයුක්ත මණ්ඩලයේ සේවය කරන බවට සංයුක්ත මණ්ඩලය සමග ගිවිසුමකට එළඹිය යුතුය.

තෝරාගනු ලබන අයදුම්කරුවන් කන්තලේ, හිඟුරාන, උඩවලව හෝ වෙනත් ස්ථානයක පිහිටි සංයුක්ත මණ්ඩලයයේ ඕනෑම ආයතනයක සේවය කිරීමට ද සූදානම් විය යුතුය. ඔවුන් විසින් ශ්‍රී ලංකා ජනරජයේ ප්‍රතිපත්තියට අනුකූලව සිංහල භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් ද ලබාගත යුතුය.

රජයේ හෝ රජයේ සංස්ථාවන්හි නිලධාරීන්, දෙපාර්තමේන්තු හෝ සංස්ථා ප්‍රධානීන් මගින් අයදුම්පත් එවිය යුතුය.

අයදුම්පත්, ලියාපදිංචි තැපෑලෙන්, සභාපති, ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය, තැ. පෙ. 1486, 651, ඇල්විටිගල මාවත, කොළඹ 5 යන ලිපිනයට 1974 ජනවාරි මස 4 වැනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුය.

සභාපති,
ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය.

1973 දෙසැම්බර් මස 10 වැනි දින,
ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය,
තැ. පෙ. 1486,
කොළඹ 5.

12–729—73.12.21 දින අංක 91 දරණ ගැසට් පත්‍රය

---

අංකය : එස්. එච්. 332/60

## පොලිස් දෙපාර්තමේන්තුව

### යාන්ත්‍රික පොලිස් කොස්තාපල් වරුන් සේවයට බඳවා ගැනීම

ශ්‍රී ලංකා පොලිස් සේවාවෙහි පහත සඳහන් කරනු ලබන වෘත්තීන් යටතේ යාන්ත්‍රික පොලිස් කොස්තාපල් තනතුරු සඳහා පහත 4 වන ඡේදයෙන් දක්වා ඇති සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

බෙලෙක් වැඩකරුවන්

පින්තාරු කරුවන්

පොරොදු වැඩකරුවන්

යාන්ත්‍රි ශිල්පීන්

ඉහත සඳහන් වෘත්තිය පිළිබඳව සුදුසුකම් ලැබූවන් පමණක් අයදුම් කළ යුතුය.

2. අයදුම්පත් පහත දී තිබෙන ආදර්ශ ආකෘති පත්‍රයෙහි සකස් විය යුතු අතර, කොළඹ 5, නාරාහේන්පිට පොලිස් ප්‍රවාහන කාර්යාලයෙහි ප්‍රවාහන සහ පණිවුඩ හුවමාරු පිළිබඳ අධ්‍යක්ෂ වෙත 74. 01. 31 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයෙහි වම්පස ඉහළ කෙළවරේ "යාන්ත්‍රික පොලිස් කොස්තාපල් තනතුරු සඳහා අයදුම් පත" යනුවෙන් සඳහන් කර, ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

3. (අ) දැනට රාජ්‍ය සේවාවෙහි යෙදී සිටින සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගේ අයදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතුය.

(ආ) අයදුම්කරුවන් අවශ්‍ය විස්තර ඔවුන්ගේම අත් අකුරින් සම්පූර්ණ කර, ඉල්ලා ඇති සහතික පිටපත් ද සමග ඉහත 2 වන ඡේදයෙහි දැක්වෙන ලිපිනයට තැපැල් කළ යුතු අතර, කුමන හේතුවක් උදෙසාවත් පොලිස්පති වෙත හෝ වෙනත් නිලධාරියෙකු වෙත පෞද්ගලිකව නොඑවිය යුතුය.

4. **වැටුප් පරිමාණය.**—රු. 3,000—90×3—රු. 3,270—රු. 3,432—144×14—රු. 5,448 වාර්ෂික (ඒකාබද්ධ)

5. **අවශ්‍ය සුදුසුකම්.**—

(අ) වයස් සීමාව: අවුරුදු 18ත් 30 අතර විය යුතුය.

**සටහන.**—1958. 03. 20 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 434න් දක්වා ඇති වයස් අනුග්‍රහය සන්නද්ධ සේවාවන්හි සේවා විමුක්ත භටයන්ට ලැබේ.

(ආ) අධ්‍යාපනික සහ වෙනත් සුදුසුකම් :—

(i) **අධ්‍යාපනික :** සිංහල දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවලින් එකක් හෝ ඊට වැඩි ගණනක් කියවීමට හා ලිවීමට හැකියාව,

(ii) **වෘත්තීය :** අයදුම්කරුවන්, පිළිගත් මෝටර් ඉංජිනේරු ශිල්ප ආයතනයක හෝ වෙනත් රජයේ දෙපාර්තමේන්තුවක අවුරුදු 4 කට නොඅඩු පුහුණු වන ආධුනිකත්ව කාලපරිච්ඡේදයක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබිය යුතුය.

(iii) **දෘෂ්ටිය පිළිබඳ අවශ්‍ය තත්ත්වය :** දෘෂ්ටිය එක් එක් ඇසින් 6/12ට අඩු නොවිය යුතුය. එක් ඇසකින් දෘෂ්ටිය 6/6 සහ අනෙක් ඇසින් 6/18 ද වේ නම් එය පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ටිය ස්වභාවික විය යුතුය.

(iv) **වෛද්‍ය :** වෛද්‍ය පරීක්ෂණයකින් සමර්ථ විය යුතුවේ.

6. **සේවයට බඳවා ගැනීමේ ක්‍රමය.**—අයදුම්කරුවන්, නාරාහේන්පිට පොලිස් ප්‍රවාහන කාර්යාලයෙහි ප්‍රවාහන සහ පණිවුඩ හුවමාරුව පිළිබඳ අධ්‍යක්ෂ විසින් පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණයකින් සමත් විය යුතු වන්නේය.

7. **සේවයෙහි යෙදවීමේ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිර වේ. පත් කරනු ලබන්නන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් විය යුතු වන අතර රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක වනු ඇත. 1972. 01. 01 දිනට පෙර විශ්‍රාම වැටුප් හිමි තනතුරු දැරුවන් ස්වකීය විශ්‍රාම වැටුප් හිමි තත්ත්වයෙහි රඳවාගනු ලබන අතර වැන්දඹු හා අනාථ දරු අරමුදලට දායක වනු ඇත. සියළුම යාන්ත්‍රික පොලිස් කොස්තාපල්වරුන් දෙපාර්තමේන්තු අරමුදල් වලට දායක වීමට නියමිත වන්නේය.

8. **සේවා කොන්දේසි.**—(i) තෝරාගනු ලබන්නන් විසින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වියයුතු වන්නේය.

(ii) තෝරාගනු ලබන අපේක්ෂකයින් ආයතන සංග්‍රහයෙහි 11 වන පරිච්ඡේදයෙහි 10 : 1 සහ 10 : 9 උප වගන්තිය යටතේ පාලනය වනු ඇත.

(iii) තෝරාගනු ලබන අපේක්ෂකයින්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පණතේ විධිවිධානයන් ක්‍රියාවට නැගීම පිණිස සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන හෝ යම් යම් ව්‍යවස්ථාවකට අනුකූලවීම අවශ්‍යය.

(iv) තෝරාගනු ලබන අපේක්ෂකයන්, ඔවුන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් "නව ප්‍රවේශකයන්" වන්නේ නම් ස්වකීය පරිවාස කාලය තුළදී සිංහල පිළිබඳ ප්‍රවීණතාවය ලබාගත යුතුය. පරිවාස කාලය අවසන් වීමෙන් පසු ඔවුන් සේවයෙහි ස්ථිර කරනු ලැබීම නියමිතව ඇති සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් සමත්වීම හා අනෙකුත් කරුණු මත රඳා පවතිනු ඇත.

සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් නියමිත මට්ටමෙන් සමත්වීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ සේවය අත්හිටවනු ලැබිය හැකි වන අතර, එහෙත් ඔවුන් විසින් රාජ්‍ය භාෂාව හැදෑරීම සඳහා නොපසුබට උත්සාහයක් දරා ඇති බවට පත්කිරීමේ බලධාරියා සෑහීමකට පත්වේ නම් සේවය අත්හිටුවීම වෙනස් විය හැකිය. නියමිත දිනට පසු සැලකිය යුතු කාල පරිච්ඡේදයක් ඇතුළත ඔවුන් පරීක්ෂණයෙන් සමත් වන්නේ නම් පත්කිරීමේ බලධාරියාගේ අභිමතය පරිදි අහිමිවූ ජ්‍යෙෂ්ඨතාවය අත්හැර දැමිය හැකිය.

(v) රාජ්‍ය සේවාවට ඇතුළත්වීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබන නිලධාරීන් ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කෙරෙනු ඇත.

(vi) තෝරාගනු ලබන අපේක්ෂකයින්, දෙපාර්තමේන්තු නියෝගයනටද, පොලිස් විනය නීති සංග්‍රහයට ද සහ පොලිස්පති විසින් හෝ රජය විසින් හෝ කලින් කල නිකුත් කරනු ලබන අනෙකුත් නියෝගයනටද යටත් වන්නාහ.

9. මෙම ගැසට් පත්‍රයෙහි I වන කොටසේ (IIඅ) ඡේදයෙහි ආරම්භයේ ප්‍රසිද්ධ කර ඇති රාජ්‍ය සේවාවනට පත්කිරීම් සම්බන්ධයෙන් අදාල පොදු කොන්දේසි වලට අවධානය **යොමු** කරවනු ලැබේ.

10. යාන්ත්‍රික ශිල්පී කොස්තාපල් වරුන් සඳහා (අ) නොමිලේ නිවාස (ආ) ඇඳුම් කට්ටල පෙට්ටිය, පලස, සපත්තු හා පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය ද සහ (ඇ) බැනියම් සහිත නිල ඇඳුම් ද නොමිලේ සපයනු ලැබේ.

11. අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් වලට පහත සඳහන් ලිය කියවිලි අමුණා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය,

(ආ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්,

(ඇ) සිවු වර්ෂ පුහුණුවන ආධුනිකත්ව කාලපරිච්ඡේදය පිළිබඳ සහතිකය.

12. අයදුම්පත් භාර ගැනීම අවසන් කරනු ලබන දිනය පසු වී ලැබෙන්නාවූද මෙම නිවේදනයට අනුකූල නොවන්නාවූ ද අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

**සටහන.**—අයදුම්කරුවනට පරීක්ෂණ සහ සම්මුඛ පරීක්ෂණ වලට පෙනී සිටීම සඳහා යාමට ගමන් වියදම් ගෙවනු නොලැබේ.

ඩී. එස්. ඊ. පී. ආර්. සේනානායක,
පොලිස්පති.

1973 දෙසැම්බර් 11 දින,
කොළඹ 1,
පොලිස් මූලස්ථානයේ දී ය.

### අයදුම් පත්‍රය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.

(පැහැදිලි අකුරෙන්)

2. ලිපිනය :————.

(පැහැදිලි අකුරෙන්)

3. උපන් දිනය සහ 74. 01. 31 දිනට වයස :————.

(i) ජාතිය :————.

(ii) ලාංකිකයෙකු වූයේ ලියාපදිංචිවීමෙන් ද පරම්පරාවෙන් ද යන වග :————.

(ලියාපදිංචි වීමෙන් නම් ලියාපදිංචි වීමේ සහතිකයේ පිටපතක් අමුණන්න)

(iii) පරම්පරාවෙන් ලාංකිකයෙකු වී නම් මතු දැක්වෙන අය උපන් ස්ථාන සඳහන් කරන්න :————.

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තා :————.

අයදුම්කරු ලංකාවේ උපන්නකු වී නම්, (අ) හැරුණ විට, (ආ) හෝ (ඇ) සහ (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුය. අයදුම්කරු ලංකාවේ නූපන් අයෙක් නම් (අ) හැරුණ විට, (ආ) සහ (ඇ) සහ (ඈ) ද පිරවිය යුතුය.

4. අධ්‍යාපනික සුදුසුකම් :—

(අ) ඔබ සමත් වී ඇත්තේ කිනම් පන්තියෙන් ද? :————.

(ආ) ඔබට සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂා කියවන්නට සහ ලියන්නට පිළිවන් ද? :————.

5. වෘත්තීය සුදුසුකම් :————.

(ඔබගේ පුහුණුවන ආධුනිකත්ව කාල පරිච්ඡේදයෙහි සිටි රක්ෂාවක නියුක්තවීම දක්වා වූ වෘත්තීය සුදුසුකම සවිස්තර ලෙස සඳහන් කරන්න. සහතික පිටපත් ඇමිණිය යුතුයි.)

6. මෝටර් රථ පැදවීම පිළිබඳ මොන යම් හෝ දැනීමක් ඔබට තිබේද? ලොරි කාර් පැදවීමට සහ මෝටර් සයිකල් පැදීමටත් බලපත්‍රයක් ඔබ සතුව ඇත් ද?

7. වෙනත් විශේෂ සුදුසුකම් :————.

8. දැනට කරන රැකියාව :————.
(රජයේ සේවයේ යෙදී සිටි නම්, අයදුම්පතේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය.)

9. ඔබ කවදා හෝ රජය යටතේ සේවය කර තිබේද ? එසේ නම්, කාල පරිච්ඡේදය, දෙපාර්තමේන්තුව සහ දැරූ තනතුර සහ ඔබ විසින් දෙපාර්තමේන්තුව හැර යන ලද්දේ කවර හේතුන් උදෙසා ද යන කරුණු පිළිබඳ විස්තර සපයන්න.

10. චරිතය පිළිබඳ සහතික ලබාගෙන ඇති පුද්ගලයන් දෙදෙනෙකුගේ නම්, තනතුරු සහ ලිපිනයෙමු ද දක්වන්න.

1.

2.

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුය)

11. ඔබ මීට පෙර ශ්‍රී ලංකා පොලිස් සේවාවෙහි රියැදුරු හෝ කොස්තාපල් තනතුරක් සඳහා ඉල්ලුම් කර තිබේද? එසේ නම්, එහි ප්‍රතිඵල සහිතව යොමුව ද ලබාගත හැකි නම් සඳහන් කරන්න.

12. ඔබ සන්නද්ධ සේවාවන්හි යෙදී සිටියෙහි ද නැතහොත් දැනට එයට අනුයුක්ත කරනු ලැබ සිටීද නැතහොත් ඔබ ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය යුද කඳවුරුවල සාමාජිකයෙකුව සිටියේ ද?

(නිදහස් කිරීමේ සහතිකයෙහි පිටපත අමුණා ඇත.)

13. ඔබ හෝ ඔබගේ කිසියම් ඥාතියකු හෝ වරදකට සම්බන්ධ වී, උසාවියට කැඳවනු ලැබ, නඩු පවරනු ලැබ හෝ කිසියම් අපරාධයක් සඳහා වරදකරුවකු ලෙස ඔප්පු වී තිබේද?

ඉහත දක්වන ලද තොරතුරු මා දන්නා තරමින් බොහෝ දුරට සත්‍ය බව හා නිවැරදි බව ද මෙයින් ප්‍රකාශ කරමි. ඉහත දැක්වූ තොරතුරුවලින් යම් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව ඔප්පු විනි නම්, පොලිස් දෙපාර්තමේන්තුවෙහි මගේ සේවාව (මා පත්කරනු ලැබූ විටදී) වහාම අවසන් කරනු ලැබීමට ඉඩ ඇත.

———————,
අයදුම්කරුගේ අත්සන.

ස්ථානය :————.

දිනය :————.

12-748—73.12.21 දින අංක 91 දරණ ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

### ප්‍රවාහන නිලධාරි තනතුර

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන නිලධාරි තනතුර සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව පිළියෙල කළ යුතු එකී අයදුම්පත් 1974. 01. 31 දින හෝ ඊට පෙර මා වෙත ලැබිය යුතුය.

2. **වැටුප් පරිමාණය :**—මෙම තනතුරට අයත් ඒකාබද්ධ වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 3,864—144 × 18—රු. 6,456 කි.

3. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**—මෙම තනතුර ස්ථිරය. එහෙත් විශ්‍රාම වැටුප් අහිමිය. මෙම තනතුරට පත් කරනු ලබන්නේ අවුරුදු තුනක පරීක්ෂණ කාලයක් පිටය. තෝරාගනු ලබන අයදුම්කරු විසින් ඔහුගේ වැටුපෙන් 6% ක් අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු අතර ඒ සඳහා රජයේ දායක මුදල ඒකාබද්ධ වැටුපෙන් 9% ක් වනු ඇත. දැනටමත් රජයේ සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි නිලධාරියෙකු තෝරාගනු ලැබුව හොත් ඔහුගේ එම අයිතිවාසිකම නොවෙනස්ව පවතිනු ඇත.

4. **අවශ්‍ය සුදුසුකම් :**—සෑම අයදුම්කරුවකු විසින්ම පහත දැක්වෙන සුදුසුකම් ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත බව,

(ආ) 74. 01. 31 වැනි දිනට වයස අවුරුදු 25 ට නොඅඩු බවට හා 40 ට නොවැඩි බවට.

(දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයට මෙම උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(ඇ) (i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය තිබීම හෝ දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයන් හය (6) කින් සමත් වූ අධ්‍යන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සාමාර්ථය ලබා තිබීම.

(ii) (අ) මෝටර් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ හෝ අදාල මෝටර් කාර්මික විද්‍යාව පිළිබඳ හෝ රජයේ කාර්මික ආයතනයකින් ලබාගත් ඩිප්ලෝමා සහතිකයක් ; හෝ

(ආ) ඒකාබද්ධ රාජධානියේ මෝටර් රථ කර්මාන්ත ආයතනයේ (ඒකාබද්ධ මණ්ඩලය) ආශ්‍රිත සාමාජිකත්වය (Associate Membership of the Institute of United Motor Industries) හෝ

(ඇ) සමාන සුදුසුකම් තිබීම ; සහ

(ඇ) (i) පිළිගත් ගරාජයක හෝ ප්‍රවාහණ ආයතනයක අවුරුදු 3 ක පළපුරුද්දක් හා මෝටර් රථ අළුත්වැඩියා කිරීම පිළිබඳව මනා දැනීමක් හා

(ii) සියළුම වර්ගවල මෝටර් වාහන පැදවීම සඳහා රියැදුරු බලපත්‍රයක් හා

(iii) මෝටර් සේවක පිරිසක් පාලනය කිරීමට හා රථ වාහන සමූහයක් නඩත්තු කිරීමට හැකියාවක් තිබීම.

5. අයදුම්කරුවන් විසින් තම ඉල්ලුම් පත්‍ර වලට පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් අමුණා එවිය යුතුය :—

(i) උප්පැන්න සහතිකය.

(ii) ලබා ඇති උසස්ම අධ්‍යාපන පිළිබඳ සහතිකය.

(iii) කාර්මික සහතිකය ; හා

(iv) මෑතක දී ලබාගත් චරිත සහතික තුනක්.

(මෙම පිටපත් ආපසු එවනු නොලැබේ.)

6. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ඡේදයේ ආරම්භයෙහි සඳහන් වන්නා වූ ද, රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාල වන්නා වූ ද, පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

සී. බී. අයි. පී. ඩී. සිරිවර්ධන,
ප්‍රධාන රේගු අයකැමි.

ශ්‍රී ලංකා රේගුව,
කොළඹ.
1973. 12. 12.

### ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර ආකෘතිය

සැ. යු.—(ඉල්ලුම් පත්‍රය බහාලන කවරයේ වම් පස මුදුන් කෙළවරේ "ප්‍රවාහණ නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය" යන පාඨය ලියා එය ලියාපදිංචි තැපෑලෙන් කොළඹ 1, ශ්‍රී ලංකා රේගුවේ ප්‍රධාන රේගු අයකැමි වෙත එවිය යුතුය.

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය හා උපන් ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)

4. ජාතිය :————.

5. විවාහක ද, අවිවාහක ද යන බව :————.

6. අධ්‍යාපන සහ/හෝ ශිල්පීය සුදුසුකම් :————.
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)

7. පාඨශාලාවෙන් අස්වූ පසු කළ රැකියා සහ/හෝ හැදෑරූ අභ්‍යාස පිළිබඳ විස්තර :————.

8. මීට කලින් ආණ්ඩුවේ යම් කිසි දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක සේවය කළේ නම් එයින් අස්වීමට හේතුව සඳහන් කරන්න :————.

9. යම් කිසි සාපරාධී වරදවලට කෙදිනක හෝ උසාවියකදී වැරදිකරු වී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම පිළිබඳ විස්තර සඳහන් කරන්න :————.

10. චරිත සහතික දී ඇති පුද්ගලයන් තිදෙනාගේ නම් සහ පදවි නාම :————.

———————,
අත්සන.

දිනය :————.

12-749—73.12.21 දින අංක 91 දරණ ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කාර්මික නිලධාරි තනතුරු

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාර්මික නිලධාරි තනතුරු සඳහා අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :—

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. මෙම පත්වීම් ප්‍රථම වශයෙන් දෙනු ලබන්නේ අවුරුදු 3 ක පරීක්ෂණ කාලයක් මතය.

(ii) තෝරාගනු ලබන අපේක්ෂකයින් දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සූදානමින් සිටිය යුතුයි.

3. වැටුප් සහ දීමනා.—මෙම තනතුරට හිමි වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේය : රු. 6,024—4×144, 8×180—රු. 8,040.

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් සහ හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත විය යුතුය.

(ආ) (i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත් වී සිටීම හෝ (ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට වැඩි නොවන වාර ගණනකදී සිංහල/දෙමළ හා අංක ගණිතය/උසස් ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් සමත්ව සිටීම හෝ (ඇ) ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත් වී සිටීම ; සහ

(ii) (අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් කෘෂිකාර්මික ඉංජිනේරු උපාධිය හෝ

(ආ) කෘෂිකාර්මික ඉංජිනේරු ජාතික ඩිප්ලෝමා හෝ

(ඇ) යාන්ත්‍රික ඉංජිනේරුවන්ගේ ආයතනයේ සාමාජිකත්ව පරීක්ෂණයේ I වැනි හා II වැනි කොටස් වලින් සාමාර්ථය හෝ

(ඈ) යාන්ත්‍රික ඉංජිනේරු ඩිප්ලෝමා (ප්‍රායෝගික හා ඉගැන්වීමේ පළපුරුද්ද ඇති අයවලුන් ගැන වැඩි සැලකිල්ලක් ද දක්වනු ලැබේ) හෝ

(ඉ) ලංකා කාර්මික විද්‍යාල දෙපාර්තමේන්තුවේ සන්ධ්‍යා පාඨමාලා ඉංජිනේරු සහතිකය සමග පස් අවුරුදු ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පළපුරුද්ද හෝ

(ඊ) ලංකා කාර්මික විද්‍යාල දෙපාර්තමේන්තුවේ සන්ධ්‍යා ඉංජිනේරු සහතිකය සමග පුහුණුවීමේ කාලයද/ආධුනික කාලයද ඇතුළුව අවුරුදු හතරක ප්‍රායෝගික හා/හෝ ඉගැන්වීමේ පළපුරුද්ද හෝ

(උ) ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ කටුබැද්ද මණ්ඩපයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ (යාන්ත්‍රික) සහතිකය සමග පුහුණුවීමේ කාලය හා/හෝ ආධුනික කාලයද ඇතුළුව අවුරුදු හතරක ප්‍රායෝගික හෝ ඉගැන්වීමේ පළපුරුද්ද හෝ.

(ඌ) ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ කාර්මික අභ්‍යාස ආයතනයේ ඩිප්ලෝමා සහතිකය සමග පුහුණුවීමේ කාලයද/ආධුනික කාලයද ඇතුළුව අවුරුදු හතරක ප්‍රායෝගික හා/හෝ ඉගැන්වීමේ පළපුරුද්ද.

(iii) 1974 ජනවාරි මස 15 දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා 35 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රජයේ ස්ථිර තනතුරු දරණ අයදුම්කරුවන්ට මෙම වයස් සීමාව බලපාන්නේ නැත.)

5. සෑම අයදුම්කරුවෙක්ම තම අයදුම්පතට පහත සඳහන් සහතික පත්වල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය :—(සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි අනුව උපකෘත පාඨශාලාවල ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(ආ) ලබාඇති උසස්ම අධ්‍යාපන සහතික.

(ඇ) මෑතදී ලබාගත් චරිත සහතික තුනක්.

(ඈ) කාර්මික සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතික (සැ. යු.—මෙම සහතික පත්වල මුල් පිටපත් අමුනා නොඑවිය යුතුයි.)

6. පහත සඳහන් ආකෘති පත්‍රයට අනුකූල වනසේ පිළියෙල කරන ලද අයදුම්පත් 1974 ජනවාරි මස 15 දින හෝ ඊට පෙර ලැබෙනසේ, පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පරිපාලන) වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම තමන්ගේ අයදුම් පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම්පත් හෝ ඊට අදාල සෑම ලියවිල්ලක්ම එවිය යුත්තේ, පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පරිපාලන) වෙතය. මගේ හෝ දෙපාර්තමේන්තුවේ වෙනත් කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට අයදුම්පත් හා ලියකියවිලි නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ඡේදයේ මුල් පිටුවේ පළවී ඇති රාජ්‍ය සේවා තනතුරුවලට අදාල පොදු කොන්දේසි කෙරෙහිද අවධානය යොමු කරවනු ලැබේ.

ඊ. අබේරත්න,
වැඩබලන කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1973 දෙසැම්බර් මස 10 දින,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දී ය.

### කාර්මික නිලධාරි තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම :————.

(අ) වාසගම :————.

(ආ) අනිකුත් නම් :————.

2. ස්ථිර ලිපිනය :————.

3. 1974 ජනවාරි මස 15 වන දිනට වයස සහ උපන් දිනය :————.

(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)

4. පියාගේ නම සහ රක්ෂාව :————.

5. උපන් ස්ථානය :————.

(අ) ඉල්ලුම්කරු :————.

(ආ) ඉල්ලුම්කරුගේ පියා :————.

(ඇ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————.

6. (අ) ජාතිය :————.

(ආ) ඔබ ලාංකිකයෙක් ද ? :————.

(i) උප්පත්තියෙන් ද ? :————.

(ii) නැතහොත් ලියාපදිංචිවීමෙන් ද ? :————.

7. ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් :————.

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

(ඇ) ඉංග්‍රීසි :————.

8. වෙනත් විස්තර :————.

ම විසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්ට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මෙම අයදුම්පතෙහි කිසියම් අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයක් තිබෙන බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් මා එයින්ම නුසුදුසු වන බවත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොගෙවා මා රාජකාරියෙන් පහකර ඇරීමට යටත්වන බවත් මම දැන සිටිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12–721/1—73.12.21 දින අංක 91 දරණ ගැසට් පත්‍රය

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව—උපදේශක තනතුරු

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපල් යන්ත්‍රෝපකරණ නඩත්තුව හා ක්‍රියාකරවීම පිළිබඳ උපදේශක තනතුරු සඳහා අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—(i) මෙම තනතුර ස්ථිරය. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. මෙම පත්වීම් ප්‍රථම වශයෙන් දෙනු ලබන්නේ අවුරුදු 3ක පරීක්ෂණ කාලයක් මතය.

(ii) තෝරා ගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සූදානම්ව සිටිය යුතුය.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේය : රු. 6,024—4×144, 8×180—රු. 8,040.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) විශිෂ්ට චරිතයකින් හා හොඳ ශරීර සනීපයෙන් යුක්ත විය යුතුයි.

(ආ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය සමත් වී සිටීම හෝ (ආ) සිංහල/දෙමළ සහ අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී සිටීම හෝ (ඉ) ඒ හා සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත් වීම සහ

(ii) (අ) පිළිගත් විශ්ව විද්‍යාලයක කෘෂිකාර්මික ඉංජිනේරු උපාධියක් හෝ

(ආ) කෘෂිකාර්මික ඉංජිනේරු ජාතික ඩිප්ලෝමා සහතිකය හෝ

(ඇ) ලංකා විශ්ව විද්‍යාලයේ හෝ පිළිගත් ඕනෑම විශ්ව විද්‍යාලයක කෘෂිකාර්මික උපාධියක් සහිත ගොවිපල් යන්ත්‍රෝපකරණ ක්ෂේත්‍රයේ දැවුරුදු පළපුරුද්දක් හෝ

(ඈ) කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ සහතිකය හෝ ලංකා කාර්මික විද්‍යාල දෙපාර්තමේන්තුවේ හෝ කටුබැද්ද ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ හෝ ඒ හා සමාන වෙනත් ආයතනයකින් හෝ ලබාගත් කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ සහතිකය සමග ගොවිපල් යන්ත්‍රෝපකරණ ක්‍රියාකරවීම හා නඩත්තුව පිළිබඳව අවුරුදු 5කට නොඅඩු පළපුරුද්ද. ලංකාවේ හෝ ඉන් බැහැරව හෝ ගොවිපල් යන්ත්‍රෝපකරණ පිළිබඳව ලබා ඇති විශේෂඥතා පුහුණුව අතිරේක සුදුසුකමක් වනු ඇත.

(iii) 1974 ජනවාරි මස 15 වැනි දිනට වයස අවුරුදු 21ට නොඅඩු හා 35ට නොවැඩි විය යුතුය. (දැනටමත් රජයේ ස්ථිර තනතුරු දරණ අයදුම්කරුවන්ට මෙම වයස් සීමාව බල පාන්නේ නැත)

5. සෑම අයදුම්කරුවෙක්ම තම අයදුම්පතට පහත සඳහන් සහතික පත්වල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු. අධ්‍යාපන රෙගුලාසි අනුව උපකෘත පාඨශාලාවල ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතිස්ම සහතික භාරගනු නොලැබේ.)

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතික,

(ඇ) මෑතකදී ලබාගත් චරිත සහතික තුනක්.

(ඈ) කාර්මික සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතික.

(සැ. යු. මෙම සහතික පත්වල මුල් පිටපත් අමුණා නො එවිය යුතුයි.)

6. පහත සඳහන් ආකෘතිපත්‍රයට අනුකූලවන සේ පිළියෙල කරන ලද අයදුම්පත් 1974 ජනවාරි 15 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පරිපාලන) වෙත ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුයි. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

7. අදුම්පත් හෝ ඊට අදාල සෑම ලියවිල්ලක්ම එවිය යුත්තේ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පරිපාලන) වෙතය. මගේ හෝ දෙපාර්තමේන්තුවේ වෙනත් කිසිම නිලධාරියකුගේ පෞද්ගලික නමට අයදුම්පත් හෝ ලියකියවිලි නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (IIඅ) වැනි ඡේදයේ මුල් පිටුවේ පළවී ඇති රාජ්‍ය සේවා තනතුරුවලට අදාල පොදු කොන්දේසි කෙරෙහිද අවධානය යොමු කරවනු ලැබේ.

ඊ. අබේරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1973 දෙසැම්බර් මස 10 වැනි දින,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දී ය.

අයදුම්පත් ආකෘතිපත්‍රය

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපල් යන්ත්‍රෝපකරණ නඩත්තුව හා ක්‍රියා කරවීම පිළිබඳ උපදේශක තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය**

1. සම්පූර්ණ නම :———.
   (අ) වාසගම :———.
   (ආ) අනිකුත් නම් :———.
2. ස්ථිර ලිපිනය :———.
3. 1974 ජනවාරි මස 15 වැනි දිනට වයස හා උපන් දිනය :——.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)
4. පියාගේ නම සහ රක්ෂාව :———.
5. උපන් ස්ථානය :—
   (අ) ඉල්ලුම්කරු :———.
   (ආ) ඉල්ලුම්කරුගේ පියා :———.
   (ඇ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :———.
6. (අ) ජාතිය :———.
   (ආ) ඔබ ලාංකිකයෙක් ද? :———.
   (i) උත්පත්තියෙන් ද? :———.
   (ii) නැතහොත් ලියා පදිංචි වීමෙන් ද? :———.
7. ලබා ඇති උස්ම අධ්‍යාපන සුදුසුකම් :—
   (අ) සිංහල :———.
   (ආ) දෙමළ :———.
   (ඇ) ඉංග්‍රීසි :———.
8. වෙනත් විස්තර :———.

මවිසින් ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මෙම අයදුම්පත්‍රයෙහි කිසියම් අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයක් තිබෙන බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් මා එයින්ම නුසුදුසු වන බවත්, තෝරා ගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොගෙවා මා රාජකාරියෙන් පහකර දැමීමට යටත්වන බවත් මම දැන සිටිමි.

———.
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

12–721/2—73.12.21 දින අංක 91 දරන ගැසට් පත්‍රය

---

### ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, 267, යූනියන් පෙදෙස, කොළඹ 2

#### ප්‍රධාන ගණකාධිකාරි තනතුර

ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් මෙම සංස්ථාවේ ප්‍රධාන ගණකාධිකාරි තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ :—

(ඒ) පිළිගත් වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයක හෝ ඊට සමාන ආයතනයක සාමාජිකත්වය ලබා සිටීම ; හා

(බී) 1973 නොවැම්බර් මස 30 වන දිනට වයස අවුරුදු 45 කට වැඩි නොවීම.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සේවය කරනු ලබන නිලධාරීන්ට වයස් සීමාව බලපානු නොලැබේ.

මෙම තනතුරට අදාල සියල්ල අඩංගු වැටුප් ක්‍රමය රු. 2,000—50—රු. 2,500 වේ.

තෝරාගත් අයදුම්කරුගේ පළපුරුද්ද හා අනෙකුත් සුදුසුකම් සලකා බැලීමෙන් පසුව මූලික වැටුප් තලයට වඩා වැඩි වැටුප් තලයක් මත තැබීමට ඉඩ ඇත.

අයදුම්පත්‍ර එවිය යුත්තේ මෙම සංස්ථාවේ පරිපාලන දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැකි නියමිත අයදුම් පත්‍ර වලය. අයදුම් පත්‍ර 1973 දෙසැම්බර් 31 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් මවෙත ලැබෙන සේ එවිය යුතුය.

රජයේ සේවයේ හෝ රජයේ සංස්ථාවල සේවයේ නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම් පත් දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු අතර, අයදුම්කරු පුරප්පාඩුව පිරවීම සඳහා තෝරා ගත හොත් ඔහු දෙපාර්තමේන්තු/සංස්ථා සේවයෙන් නිදහස් කළ හැකි බව දැන්විය යුතුය.

ප්‍රධාන අධිකාරී (පරිපාලන).

12–750—73.12.21 දින අංක 91 දරන ගැසට් පත්‍රය

## ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

### පුස්තකාලයාධිපති තනතුර ((IV වැනි ශ්‍රේණිය)

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවෙ ඉහත දක්වෙන තනතුර සඳහා ලංකාවේ පුරවැසි ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම මෙයින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. ඉල්ලුම්පත් පහත සඳහන් ආකෘතියට අනුව පිළියෙල කොට 1974.01.21 දින හෝ ඊට පෙර අධ්‍යක්ෂ, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, තැ. පෙ. 854, කොළඹ 7. යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුයි.

**සංලක්ෂ්‍යය.**—අයදුම් පත් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාදවූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා තට අයදුම් පත් පමා කරන අයදුම් කරුවන් ඉන් සිදුවිය හැකි අලාභහානි තමන් විසින්ම විඳ දරා ගත යුතුයි.

2. **වැටුප් හා දීමනා**—වර්ෂයකට රු. 6,600—180 × 8 හා 240 × 6—රු. 9,480 ක ඒකාබද්ධ වැටුප් ක්‍රමය හිමිවේ. රු. 7,500 ට හා රු. 8,280 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් සහිතයි.

**සටහන.**—1969.10.01 වැනි දිනට පෙර මෙම වැටුප් පරිමාණයට අනුරූපව පැවති මූලික වැටුප් පරිමාණය රු. 3.900—180 × 8 සහ 240 × 6—රු. 6,780 වේ.

3. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි**—මෙම තනතුර ස්ථිරය. පත්වීම අර්ථසාධක අරමුදල් පදනමක් මත වනු ඇත. තෝරාගනු ලබන අපේක්ෂකයා/අපේක්ෂිකාව දැනටමත් විශ්‍රාම වැටුප් සහිත රජයේ තනතුරක් නොදරයි නම් ඔහු/ඇය තම වැටුපෙන් සියයට 6 ක මුදලක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය. රජයේ දායක මුදල වැටුපෙන් සියයට 9 ක් වනු ඇත.

තෝරාගනු ලබන අපේක්ෂකයා/අපේක්ෂිකාව පත්වීම ලබන දින රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරයි නම්, ඔහු/ඇය තව දුරටත් එම විශ්‍රාම වැටුප් අයිතිය භුක්ති විඳිනු ඇත.

තෝරාගනු ලබන අපේක්ෂකයා/අපේක්ෂිකාව දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත නොමැති නම් මුල්වතාවේ තුන් අවුරුදු පරිවාස කාලයක් මත පත් කෙරෙනු ඇත. තෝරාගනු ලබන අපේක්ෂකයා/අපේක්ෂිකාව රාජ්‍ය සේවයෙහි ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරයි නම් ඔහුගේ/ඇයගේ පත්වීම එක් අවුරුදු කාලපරිච්ඡේදයක් සඳහා වැඩබැලීමේ පදනමක් මත වනු ඇත.

4. **සුදුසුකම්**—(අ) අයදුම් පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩිවීම. (දැනටමත් රජයේ සේවයේ සිටින අයට මෙම උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(ආ) විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර ශක්තියකින් යුක්තවීම.

(ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් හා එයට අමතරව, ලංකා පුස්තකාල සංගමයේ මධ්‍යම පරීක්ෂණය හෝ කණිෂ්ඨ විශ්ව විද්‍යාලයක පුස්තකාල විද්‍යාව (පුස්තකාලයාධිපතිත්වය) පිළිබඳ ඩිප්ලෝමාව හෝ ඒ හා සමාන සුදුසුකමක් තිබීම

සහ

(ඈ) ඉහත (ඇ) හි සඳහන් සුදුසුකම් සමග අවුරුදු 10 ක ප්‍රායෝගික පළපුරුද්දක් තිබීම.

(ඉ) IV වැනි ශ්‍රේණියේ පුස්තකාලයාධිපතින් වර්ෂයකට රු. 8,040 (ඒකාබද්ධ) වැටුප් ලක්ෂ්‍යය ඉක්මවා යාමට පෙර ලංකා පුස්තකාල සංගමයේ අවසාන වර්ෂයේ හෝ ඒ හා සමාන විභාගයකින් සමත් විය යුතුය.

(ඊ) සිංහල හා ඉංග්‍රීසි ද ඕනෑම ස්වාභාවික විද්‍යාවක්/ප්‍රාචීන භාෂාව පිළිබඳ මනා දැනුමක් ලබා තිබීම.

**සටහන.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ එයට සමාන හෝ උසස් සහතිකයක් සහිතව, ලංකා පුස්තකාල සංගමයේ මධ්‍යම පරීක්ෂණය හෝ කණිෂ්ඨ විශ්ව විද්‍යාලයක පුස්තකාල විද්‍යාව (පුස්තකාලයාධිපතිත්වය) පිළිබඳ ඩිප්ලෝමාව හෝ ඒ හා සමාන සුදුසුකම් සමග අවුරුදු 10 ක ප්‍රායෝගික පළපුරුද්දක් ඇති මෙම දෙපාර්තමේන්තුවේ සේවකයින්ට ද මේ තනතුර සඳහා ඉල්ලුම් කළ හැක.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම හෝ ඉල්ලා සිටි විටක අයදුම්කරුවන් ඒවා ඉදිරිපත් කළ යුතුය:—

(අ) උප්පැන්න සහතිකය.

(සැලකිය යුතුයි.—බෞතිස්ම සහතික හෝ උපකෘත පාසැල් පිළිබඳ රෙගුලාසි සංග්‍රහයෙහි කාර්යයන් සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතික හෝ පිළිගනු නොලැබේ.)

(ආ) ඉහත 3 (ඇ) හි දක්වෙන අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික.

(ඇ) ප්‍රායෝගික පළපුරුද්ද පිළිබඳ සහතික.

(ඈ) සිංහල, දෙමල හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

(ඉ) චරිතය පිළිබඳ සඳහන් වන මෑතකදී ලබාගත් සහතික දෙකක්.

**සටහන.**—(i) අයදුම් පත්‍රයට කිසිම ලියවිල්ලක් හෝ ලියවිල්ලක පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(ii) ඉල්ලා සිටි විටක ලියකියවිලි ඉදිරිපත් කිරීමට අසමත්වන අයදුම් කරුවන්ගේ අයදුම් පත් ගැන සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ අයදුම් පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම්පත් සහ ඒ හා සම්බන්ධ සෙසු ලියකියවිලි එවිය යුත්තේ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙතය. ඒවා දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පුද්ගලික නමට නොඑවිය යුතුය.

8. තෝරාගනු ලැබූ අපේක්ෂකයා/අපේක්ෂිකාව රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිසද, විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධි විධාන ක්‍රියාවේ යෙදවීම පිණිසද, දැනට පනවා ඇති හා මින් මතුවට පනවනු ලබන ඕනෑම ව්‍යවස්ථාවකට අනුකූලව ක්‍රියා කිරීම පිණිසද බැඳී සිටිය යුතුය.

මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (IIඅ) වන ඡෙදයෙහි, ආරම්භයෙහි සඳහන්වන රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත්වීම්වලට අදාලවූ පොදු කොන්දේසි කියවා බලනු මැනවි.

ආචාර්ය පී. එච්. ඩී. එච්. ද සිල්වා,<br>
ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ.

1973 දෙසැම්බර් මස 12 වැනි දින,<br>
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව,<br>
කොළඹ 7.

### ආකෘති පත්‍රය

(සැ.යු. 18½" × 3½" ප්‍රමාණයේ කඩදාසිවල සකස්කළ යුතු අතර, ඉල්ලුම් පත්‍රය බහාලන කවරයේ වම් පස මුදුන් කෙළවරේ " පුස්තකාලයාධිපති තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය " යනුවෙන් සඳහන්කර ලියාපදිංචි කළ තැපෑලෙන් ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත එවිය යුතුයි. (ඉල්ලුම්පත්‍ර ලැබුණු බැව් අපේක්ෂකයන්ට දන්වනු ලැබේ.)

### ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ පුස්තකාලයාධිපති තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය

1. නම : (මුලකුරු සමග) ———— මහතා/මහත්මිය/මෙනෙවිය
2. මුලකුරුවලින් හැඳින්වෙන නම :————
3. ලිපිනය :————
4. (අ) ලාංකිකයෙක්ද යන වග :————

   (ආ) එසේනම් පරම්පරාවෙන්ද, ලියාපදිංචිවීමෙන්ද යන වග :———— පරම්පරාවෙන් නම් පහත සඳහන් අය උපන් ස්ථානයන් සඳහන් කරන්න:—

   (i) අයදුම්කරු :————

   (ii) අයදුම්කරුගේ පියා :————

   (iii) අයදුම්කරුගේ පියාගේ පියා :————

   (iv) අයදුම්කරුගේ පියාගේ පියාගේ පියා :————
5. උපන් දිනය : අවුරුද්ද————, මාසය————, දිනය————
6. අයදුම් පත් භාරගන්නා අවසාන දිනට වයස :—
   අවු :———— මාස :———— දින :————
7. විවාහකද ? අවිවාහකද ? යන වග :————
8. අධ්‍යාපනික සුදුසුකම් :—

| විභාගය/උපාධිය | වර්ෂය | විෂයයන් |
|---|---|---|
| | | |

9. ප්‍රායෝගික පළපුරුද්ද :—

| දැරූ තනතුරු සහ කාර්යයන්ගේ ස්වභාවය | සේවය කළ ස්ථාන | කාල පරිච්ඡේද |
|---|---|---|
| | | |

10. දැනට දරන තනතුර පිළිබඳ විස්තර :—

(අ) තනතුර :————

(ආ) දෙපාර්තමේන්තුව/ආයතනය :————

(ඇ) පත්වූ දිනය :————

(ඈ) ස්ථිරද, විශ්‍රාම වැටුප් සහිතද, තාවකාලිකද යන වග :————

(ඉ) තනතුරෙහි ස්ථිර කරනු ලැබ ඇත්ද යනවග :————

(ඊ) වැටුප් පරිමාණය හා දැනට ලබන වැටුප :————

11. ඔබ ගැන තොරතුරු විමසා දැනගතහැකි පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සඳහන් කරන්න:—

(1) ————

(2) ————

12. වෙනත් කරුණු :————

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර දැනගත-හොත් මා නුසුදුස්සෙකු වීමට යටත් බවත්, පත්කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————

අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්තව නම් ඔහු/ඇය පිළිබඳ දෙපාර්ත-මේන්තු ප්‍රධානියාගේ වාර්තාව.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————

12–754—73.12.21 දින අංක 91 දරන ගැසට් පත්‍රය

---

### ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

#### ප්‍රවෘත්ති/ප්‍රකාශන නිලධාරී (සිංහල) II ශ්‍රේණිය තනතුර
#### පුස්තකාලයාධිපති II ශ්‍රේණිය තනතුර

ඉහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. ආයතනයෙන් ලබා ගත හැකි නියමිත ආකෘති පත්‍රවල පිළියෙල කළ අයදුම්පත් අදාළ ලියකියවිලි ද සමග 1974 ජනවාරි 8 වන දින හෝ ඉන් පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන්, කොළඹ 5, එලිබෑන්ක් පාරේ අංක 33 දරණ ස්ථානයේ පිහිටි ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ වෙත එවිය යුතු වේ.

තැපැල් මගින් හෝ පැමිණ හෝ ආකෘති පත්‍ර ලබා ගත හැකි වේ. ආකෘති පත් තැපැල් මගින් ලබා ගැනීමට නම් ලිපිනය සහිත මුද්දර ගැසූ ලියුම් කවරයක් ඉදිරිපත් කළ යුතු වේ. එකකට වැඩි තනතුරු ගණනක් සඳහා අයදුම් කිරීමට අදහස් කරන අය එක් එක් තනතුර සඳහා වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ.

**ප්‍රවෘත්ති/ප්‍රකාශන නිලධාරී (සිංහල) II ශ්‍රේණිය තනතුර:**

**පළපුරුද්ද හා සුදුසුකම්.**—(1) (අ) අ.පො.ස. (උසස් පෙළ) පරීක්ෂණයේදී සිංහල ඇතුලුව එකම වරකදී විෂයයන් 4 කින් සමත්වීම හෝ සිංහල ඇතුළුව පිළිගත් විශ්ව විද්‍යාලයක මධ්‍ය පරීක්ෂණය සමත් වීම,

(ආ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) පරීක්ෂණයෙන් ඉංග්‍රීසිවලින් සම්මාන සාමාර්ථයක් ; සහ

(ඇ) පිළිගත් ආයතනයක ප්‍රවෘත්ති හා ප්‍රකාශන ක්ෂෙත්‍රයේ යටත් පිරිසෙයින් අවුරුදු 5 ක පළපුරුද්ද; හෝ

(2) (අ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) පරීක්ෂණයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල සහ ඉංග්‍රීසි ඇතුළුව විෂයයන් 4කින් සම්මාන සාමාර්ථය සහ අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් සමත්වීම; සහ

(ආ) පිළිගත් ආයතනයක ප්‍රවෘත්ති හා ප්‍රකාශන කටයුතු පිළිබඳව ක්ෂෙත්‍රයේ අවුරුදු 10ක පළපුරුද්ද.

කෘෂිකර්මය පිළිබඳ ප්‍රශ්න සහ ගොවි කටයුතු ක්ෂේත්‍රයේ පළ පුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සළකනු ලැබේ.

**වයස.**—අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 22—35 අතර විය යුතුය. රජයේ හෝ සංස්ථාවල සේවයේ යෙදී සිටින අපේක්ෂකයින් සඳහා ඉහළ වයස් සීමාව බල නොපැවැත්වෙනු ඇත.

**වැටුප් ක්‍රමය.**—රු. 570—9×20 ; 6×25—රු. 900 මාසික ඒකාබද්ධ වැටුප.

වැඩි ඉහළ සුදුසුකම් හා පළපුරුද්ද ඇති අපේක්ෂකයන් මෙම වැටුප් ක්‍රමයේ සුදුසු වැටුප් තලයක තැබීම ගැන සලකා බලනු ලැබේ.

**පුස්තකාලයාධිපති (II) ශ්‍රේණිය තනතුර:**

**පළපුරුද්ද හා සුදුසුකම්.**—(1) (i) අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී විෂයයන් 3කින් එක්වර සමත් වී තිබීම ; හෝ පිළිගත් විශ්ව විද්‍යාලයක මධ්‍ය පරීක්ෂණය සමත් වී තිබීම ; සහ

(ii) (අ) පිළිගත් ආයතනයක පුස්තකාල සේවයේ අවුරුදු 5 ක පළපුරුද්ද; හෝ

(ආ) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ මධ්‍ය පරීක්ෂණය සමත් වී තිබීම; හෝ

(ඇ) කණිෂ්ඨ විශ්ව විද්‍යාලයකින් පුස්තකාල විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම ; හෝ

(2) (i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය/අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් 6 කින් එක්වර සමත් වී තිබීම.

(ii) (අ) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ මධ්‍ය පරීක්ෂණය සමත් වී තිබීම ; හෝ

(ආ) කණිෂ්ඨ විශ්ව විද්‍යාලයකින් පුස්තකාල විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම ; සහ

(iii) පිළිගත් ආයතනයක පුස්තකාල සහකාරවරයෙකු වශයෙන් අවුරුදු 3ක පළපුරුද්ද.

ගොවි කටයුතු අංශයට අදාළ ශික්ෂණයන් පිළිබඳ දැනුමක් ඇති අයදුම්කරුවන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ඇත.

**වයස.**—අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 25 ටත් 35 ටත් අතර විය යුතුය. රජයේ හෝ සංස්ථාවල සේවයේ යෙදී සිටින අපේක්ෂකයින් සඳහා ඉහළ වයස් සීමාව බල නොපැවැත් වෙනු ඇත.

**වැටුප් ක්‍රමය.**—රු. 570—9×20 ; 6×25—රු. 900 මාසික ඒකාබද්ධ වැටුප.

වැඩි ඉහළ සුදුසුකම් හා පළපුරුද්ද ඇති අපේක්ෂකයන් මෙම වැටුප් ක්‍රමයේ සුදුසු වැටුප් තලයක තැබීම ගැන සලකා බලනු ලැබේ.

මෙම ආයතනයෙන් ලබා ගත් ආකෘති පත්‍රවල පිළියෙල නොවූ අයදුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ. විස්තරාත්මක සේවා කොන්දේසි හා නියමයන් අයදුම්පත් ආකෘතිවල දක්වා ඇත.

අධ්‍යක්ෂ,
ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය.

33, එලිබෑන්ක් පාර,
කොළඹ 5.

12–757—73.12.21 දින අංක 91 දරණ ගැසට් පත්‍රය

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

ඇබෑර්තු

| ශ්‍රෙණිය | | තනතුර | වැටුප් පරිමාණය |
|---|---|---|---|
| 1. | බී–3 | ... ටෙලෙක්ස් යන්ත්‍ර ක්‍රියාකරු | රු. 265—525 / 7 × 10:6 × 15:5 × 20 |
| 2. | බී–3 | ... ලිපිකරු—යතුරුලේඛක (නීති කාර්යාංශය සඳහා) | රු. 265—525 / 7 × 10:6 × 15:5 × 20 |

**තනතුරුවලට අදාල සුදුසුකම :**

අංක 1 (අ) දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි, සිංහල හා ගණිතය/අංක ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් 6 කින් යුත් අ.පො.ස (සා) විභාගය හෝ ඊ හා සමාන වෙනත් විභාගයක් සමත්වී සිටිය යුතුය.

(ආ) විනාඩියකට වචන 40 ක වේගයෙන් ඉංග්‍රීසි යතුරු ලියනයෙහි හැකියාවක් තිබිය යුතුය.

(ඇ) ටෙලෙක්ස් යන්ත්‍රය ක්‍රියා කරවීමෙහි පළපුරුද්දක් තිබිය යුතුය.

(ඈ) ඉංග්‍රීසි ලඝුලේඛනයෙහි හැකියාවක් තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.

අංක 2 (අ) දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල හා අංක ගණිතය/ගණිතය ඇතුලුව විෂයයන් 6 කින් අ.පො.ස. (සා) විභාගය හෝ ඊ හා සමාන වෙනත් විභාගයක් හෝ උසස් විභාගයක් සමත්වී සිටිය යුතුය.

(ආ) නීතිඥයෙකු යටතේ ලිපිකරුවෙකු වශයෙන් අවුරුදු 10 ක පළපුරුද්දක් හෝ සැළකිය යුතු තත්ත්වයේ නීතිඥ ආයතනයක ලිපිකරුවකු වශයෙන් අවුරුදු 5 ක පළපුරුද්දක් හෝ තිබිය යුතුය.

(ඇ) සිංහල හා/හෝ ඉංග්‍රීසි යතුරු ලියනය කළහැකි අයට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ඈ) වයස අවුරුදු 21 ත් 45 ත් අතර විය යුතුය.

**සාමාන්‍ය කොන්දේසි :**

තෝරා ගනු ලබන අපේක්ෂකයින් :

1. (i) සිය ශාරීරික යෝග්‍යතාව දක්වීම සඳහා පත්වීම ලැබීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතුය.

(ii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරනු ලබන ප්‍රමාණයක සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් සිය පරිවාස කාලය තුළදී ලබා ගත යුතුය.

(iii) සිය වැටුපෙන් 6%ක් සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක විය යුතුය.
(ඊ සඳහා සංස්ථාව විසින් 9%ක් දායක වනු ඇත.)

2. තෝරා ගනු ලබන අයදුම්කරුවන් අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

අයදුම්පත් කැඳවනුයේ ඉහත දක්වා තිබෙන සුදුසුකම ඇති, ලාංකිකයින් ගෙන් පමණි. සම්පූර්ණ විස්තර ඇතුළත් අයදුම්පත් 1973 දෙසැම්බර් මස 31 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ, සේවක මණ්ඩල නිළධාරී (රැකියා), ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව, 113, ගාලු පාර, කොළඹ 3 යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය.

රජයේ දෙපාර්තමේන්තුවල හෝ සංස්ථාවන්හි සේවකයින් විසින් එවනු ලබන අයදුම්පත් සලකා බලනුයේ ඔවුන් විසින් ඒවා අදාල දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළහොත් පමණි. අංක 666 හා 1965.08.20 වන දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයෙහි දක්වෙන වගන්ති වලට අනුව අදාල නිළධාරියා සිය සේවයෙන් නිදහස් කළ හැකිද යන්න දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානියා විසින් සඳහන් කළ යුතුය.

ගි. සාමාන්‍යාධිකාරි (පාලන).

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව,
113, ගාලු පාර, කොළඹ 3.

12–723—73.12.21 දින අංක 91 දරණ ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන අමාත්‍යාංශය

### ලංකා කාර්මික විද්‍යාලය—බාහිර කථිකාචාර්ය තනතුරු

### 1974 අධ්‍යයන වර්ෂය

කොළඹ ලංකා කාර්මික විද්‍යාලයේ බාහිර කථිකාචාර්ය තනතුරු සඳහා අයදුම්පත් භාරගනු ලැබේ. පහත සඳහන් පාඨමාලා විෂයයන් හා මාධ්‍යයන් සඳහා බාහිර කථිකාචාර්යවරුන් වුවමනා කර තිබේ :—

#### ගණකාධිකරණ අංශය

| පාඨ මාලාව | මාධ්‍යය | දිවා/සන්ධ්‍යා | විෂයයන් |
|---|---|---|---|
| ගණකාධිකරණ ඩිප්ලෝමා I ... | ... සිංහල | සන්ධ්‍යා ... | (1) වාණිජ නීති මූලධර්ම |
| ගණකාධිකරණ ඩිප්ලෝමා II ... | ... සිංහල | ... සන්ධ්‍යා ... | (2) ගණකාධිකරණ I සීමාසහිත ගිණුම ඇතුළුව |
| | | | (3) ගණකාධිකරණ II හවුල් ව්‍යාපාර ගිණුම් ඇතුළුව |
| | | | (4) විගණනය |
| | | | (4) සංඛ්‍යා ලේඛන හා පිරිවැය මූලධර්ම |
| | | | (5) වාණිජ නීතිය |
| ගණකාධිකරණ ඩිප්ලෝමා III ... | ... සිංහල | ... සන්ධ්‍යා ... | (1) උසස් ගණකාධිකරණය I සීමාසහිත සමාගම ඇතුළුව |
| | | | (2) උසස් ගණකාධිකරණය II හවුල් ව්‍යාපාර ඇතුළුව |
| | | | (3) හවුල් ව්‍යාපාර හා සීමාසහිත සංගම් නීතිය |
| | | | (4) අද්මිනිස්ත්‍රාත්කාර යනාදි නීතිය |
| ගණකාධිකරණ ඩිප්ලෝමා IV ... | ... සිංහල | ... සන්ධ්‍යා ... | (1) කළමනාකාර ගිණුම |
| | | | (2) විගණනය |
| | | | (3) බදුක්‍රම |
| | | | (4) සාමාන්‍ය මූල්‍ය දැනුම |
| ගණකාධිකරණ ඩිප්ලෝමා I ... | ... ඉංග්‍රීසි | ... සන්ධ්‍යා ... | (1) පොත්තැබීම හා ගිණුම් |
| | | | (2) ආර්ථික විද්‍යා මූලධර්ම |
| | | | (3) වාණිජ නීති මූලධර්ම |
| | | | (4) සාමාන්‍ය වාණිජ දැනුම |
| ගණකාධිකරණ ඩිප්ලෝමා II ... | ... ඉංග්‍රීසි | ... සන්ධ්‍යා ... | (1) ගණකාධිකරණය සීමාසහිත සමාගම ගිණුම ඇතුළුව |
| | | | (2) ගණකාධිකරණය II හවුල් ව්‍යාපාර ගිණුම් ඇතුළුව |
| | | | (3) විගණනය |
| | | | (4) සංඛ්‍යා ලේඛන හා පිරිවැය මූලධර්ම |
| | | | (5) සාමාන්‍ය වාණිජ දැනීම |
| | | | (6) වාණිජ නීතිය |
| ගණකාධිකරණ ඩිප්ලෝමා III ... | ... ඉංග්‍රීසි | ... සන්ධ්‍යා ... | (1) උසස් ගණකාධිකරණය I සීමාසහිත ගිණුම් ඇතුළුව |
| | | | (2) උසස් ගණකාධිකරණය II හවුල් ව්‍යාපාර ඇතුළුව |
| | | | (3) හවුල් ව්‍යාපාර හා සීමාසහිත නීතිය |
| | | | (4) අද්මිනිස්ත්‍රාත්කාර යනාදි නීතිය |
| ගණකාධිකරණ ඩිප්ලෝමා IV ... | ... ඉංග්‍රීසි | ... සන්ධ්‍යා ... | (1) කළමනාකාර ගිණුම |
| | | | (2) විගණනය |
| | | | (3) බදුක්‍රම |
| | | | (4) සාමාන්‍ය මූල්‍ය දැනුම |

| පාඨ මාලාව | මාධ්‍යය | දිවා/සන්ධ්‍යා | විෂයයන් |
|---|---|---|---|
| ගණකාධිකරණ ඩිප්ලෝමා I | දෙමළ | සන්ධ්‍යා | (1) පොත්තැබීම හා ගිණුම්<br>(2) ආර්ථික විද්‍යා මූලධර්ම<br>(3) වාණිජ නීති මූලධර්ම |
| ගණකාධිකරණ ඩිප්ලෝමා II | දෙමළ | සන්ධ්‍යා | (1) ගණකාධිකරණය I සීටාසහිත ගිණුම් ඇතුළුව<br>(2) ගණකාධිකරණය II හවුල්ව්‍යාපාර ගිණුම් ඇතුළුව<br>(3) විගණනය<br>(4) සංඛ්‍යා ලේඛන හා පිරිවැය මූලධර්ම<br>(5) සාමාන්‍ය වාණිජ දැනීම<br>(6) වාණිජ නීතිය |
| පිරිවැය ගණකාධිකරණය I | ඉංග්‍රීසි | දිවා | (1) පොත්තැබීම හා ගණකාධිකරණය<br>(2) ආර්ථික විද්‍යාව<br>(3) කාර්මික පරිපාලනය<br>(4) සංඛ්‍යා ලේඛණය<br>(5) ව්‍යාපාර ගණිතය |
| පිරිවැය ගණකාධිකරණය I | ඉංග්‍රීසි | සන්ධ්‍යා | (1) පොතැබීම හා ගණකාධිකරණය<br>(2) ආර්ථික විද්‍යාව<br>(3) කාර්මික පරිපාලනය<br>(4) සංඛ්‍යා ලේඛනය<br>(5) ව්‍යාපාර ගණිතය |
| පිරිවැය ගණකාධිකරණය II | ඉංග්‍රීසි | සන්ධ්‍යා | (1) පිරිවැය ගණකාධිකරණය I<br>(2) පිරිවැය ගණකාධිකරණය II<br>(3) පිරිවැය ගණකාධිකරණය III |
| ලේඛන ශාස්ත්‍රය I | ඉංග්‍රීසි | දිවා | (1) ගණකාධිකරණය<br>(2) ආර්ථික විද්‍යා න්‍යාය<br>(3) ඉංග්‍රීසි නීතිය පිළිබඳ මූලධර්ම<br>(4) ඉංග්‍රීසි භාෂාව |
| ලේඛන ශාස්ත්‍රය I | ඉංග්‍රීසි | සන්ධ්‍යා | (1) ගණකාධිකරණය<br>(2) ආර්ථික විද්‍යා න්‍යාය<br>(3) ඉංග්‍රීසි නීතිය පිළිබඳ මූලධර්ම<br>(4) ඉංග්‍රීසි භාෂාව |
| ලේඛන ශාස්ත්‍රය II | ඉංග්‍රීසි | සන්ධ්‍යා | (1) ආර්ථික ප්‍රතිපත්ති හා ගැටලු<br>(2) ලේඛන ශාස්ත්‍රය හා පරිපාලන පලපුරුද්ද<br>(3) ඉංග්‍රීසි වෙළෙඳ නීතිය |
| බැංකුක්‍රම I | ඉංග්‍රීසි | සන්ධ්‍යා | (1) පොත්තැබීම සහ ගණකාධිකරණය<br>(2) ආර්ථික විද්‍යා න්‍යාය<br>(3) ඉංග්‍රීසි නීතිය පිළිබඳ මූලධර්ම<br>(4) ඉංග්‍රීසි භාෂාව<br>(5) ආර්ථික භූගෝලය |
| ප්‍රවාහන I | ඉංග්‍රීසි | සන්ධ්‍යා | (1) ප්‍රවාහනය<br>(2) සම්බන්ධන්ධතා පිළිබඳ මූලය පුහුණුව<br>(3) සංඛ්‍යා ලේඛණය |
| හෝටල් පාලනය | ඉංග්‍රීසි | දිවා | (1) හෝටල් පාලනය (2) ආහාර සම්පාදනය<br>(3) ජපන් භාෂාව (4) ප්‍රංශ භාෂාව (5) ජර්මන් භාෂාව |
| සංචාරක ව්‍යාපාරය | ඉංග්‍රීසි | දිවා | (1) සංචාරක ව්‍යාපාරය (2) ජපන් භාෂාව<br>(3) ප්‍රංශ භාෂාව (4) ජර්මන් භාෂාව<br>(5) ලංකාව පිළිබඳ පසුබිම් දැනීම |

**වාණිජ ඉංග්‍රීසි අංශය**

| | | | |
|---|---|---|---|
| ජාතික උසස් වාණිජ ඩිප්ලෝමා I | ඉංග්‍රීසි | දිවා | (1) ශ්‍රී ලංකාවේ දේශපාලන හා සමාජ සංගම්<br>(2) ව්‍යාපාර ගණිතය |
| ජාතික උසස් වාණිජ ඩිප්ලෝමා II | ඉංග්‍රීසි | දිවා | (1) ව්‍යවහාර අර්ථ ශාස්ත්‍රය |
| ජාතික උසස් වාණිජ ඩිප්ලෝමා III | ඉංග්‍රීසි | දිවා | (1) ව්‍යවහාර අර්ථ ශාස්ත්‍රය<br>(2) දේශපාලන න්‍යාය<br>(3) ගණකාධිකරණය |
| ජාතික උසස් වාණිජ ඩිප්ලෝමා IV | ඉංග්‍රීසි | දිවා | (1) බදු ක්‍රමය<br>(2) රාජ්‍ය මූල්‍ය<br>(3) ගණකාධිකරණය |
| තක්සේරු ඩිප්ලෝමා I | ඉංග්‍රීසි | දිවා | (1) මිනුම් හා මට්ටම් කිරීම න්‍යාය<br>(2) මිනුම් හා මට්ටම් කිරීම ප්‍රායෝගික |
| තක්සේරු ඩිප්ලෝමා II | ඉංග්‍රීසි | දිවා | (1) මිනුම් හා මට්ටම් කිරීම න්‍යාය<br>(2) මිනුම් හා මට්ටම් කිරීම ප්‍රායෝගික<br>(3) තක්සේරු කිරීම |
| තක්සේරු ඩිප්ලෝමා III | ඉංග්‍රීසි | සන්ධ්‍යා | (1) තක්සේරු කිරීම<br>(2) කෘෂිකර්මය<br>(3) පලාත් පාලන මුදල්<br>(4) නාගරික නිර්මාණය |
| තක්සේරු ඩිප්ලෝමා IV | ඉංග්‍රීසි | සන්ධ්‍යා | (1) තක්සේරු කිරීම<br>(2) කෘෂිකර්මය<br>(3) පලාත් පාලන මුදල් |

| පාඨ මාලාව | මාධ්‍යය | දිවා/සන්ධ්‍යා | විෂයයන් |
|---|---|---|---|
| ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ජාතික පාඨමාලාව ... | ඉංග්‍රීසි ... | සන්ධ්‍යා ... | (1) ගණකාධිකරණය<br>(2) වාණිජ අංක ගණිතය<br>(3) සමාජ අධ්‍යයනය<br>(4) ආර්ථික විද්‍යාව ඇතුළු සාමාන්‍ය වාණිජ දැනුම<br>(5) පිරිවැය<br>(6) විකුණුම් ශාස්ත්‍රය හා විකුණුම් පාලනය<br>(7) ඉංග්‍රීසි භාෂාව |
| ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ජාතික පාඨමාලාව ... | ඉංග්‍රීසි ... | දිවා ... | (1) ලඝු ලේඛනය<br>(2) සමාජ අධ්‍යයනය<br>(3) පිරිවැය<br>(4) විකුණුම් ශාස්ත්‍රය හා විකුණුම් පාලනය<br>(5) ආර්ථික විද්‍යාව ඇතුළු සාමාන්‍ය වාණිජ දැනුම |
| උසස් වාණිජ සහතික පත්‍ර පාඨමාලාව ... | ඉංග්‍රීසි ... | සන්ධ්‍යා ... | (1) වාණිජ්‍යය හා මුදල්<br>(2) වාණිජ අංක ගණිතය |
| උසස් ලඝුලේඛනය ... ... | ඉංග්‍රීසි ... | සන්ධ්‍යා ... | (1) ලඝුලේඛනය |
| විකුණුම් ශාස්ත්‍රය හා විකුණුම් පාලනය ... | ඉංග්‍රීසි ... | සන්ධ්‍යා ... | (1) විකුණුම් ශාස්ත්‍රය හා විකුණුම් පාලනය |

**වාණිජ සිංහල ඩිප්ලෝමා අංශය**

| | | | |
|---|---|---|---|
| ජාතික උසස් වාණිජ ඩිප්ලෝමා I ... ... | සිංහල ... | දිවා ... | (1) ව්‍යාපාර ගණිතය |
| ජාතික උසස් වාණිජ ඩිප්ලෝමා II ... ... | සිංහල ... | දිවා ... | (1) ව්‍යාපාර ගණිතය |
| ජාතික උසස් වාණිජ ඩිප්ලෝමා IV ... ... | සිංහල ... | දිවා ... | (1) ගණකාධිකරණය<br>(2) පිරිවැය ගණකාධිකරණය<br>(3) බදු ක්‍රමය |
| ජාතික උසස් තක්සේරු ඩිප්ලෝමා I ... ... | සිංහල ... | දිවා ... | (1) මිනුම් හා මට්ටම් කිරීම |
| ජාතික උසස් තක්සේරු ඩිප්ලෝමා II... ... | සිංහල ... | දිවා ... | (1) මිනුම් හා මට්ටම් කිරීම<br>(2) තක්සේරු විද්‍යාව |
| ජාතික උසස් තක්සේරු ඩිප්ලෝමා III ... | සිංහල ... | සන්ධ්‍යා ... | (1) තක්සේරු විද්‍යාව<br>(2) ඉඩම් සම්බන්ධ නීතිය<br>(3) නගර නිර්මාණ ශිල්පය<br>(4) කෘෂිකර්මය<br>(5) පලාත් පාලන නීතිය හා මුදල් |
| ජාතික උසස් තක්සේරු ඩිප්ලෝමා IV ... | සිංහල ... | සන්ධ්‍යා ... | (1) තක්සේරු විද්‍යාව<br>(2) කෘෂිකර්මය<br>(3) පලාත් පාලන නීතිය<br>(4) පලාත් පාලන මූල්‍ය |

**වාණිජ සිංහල සන්ධ්‍යා අංශය**

| | | | |
|---|---|---|---|
| ව්‍යාපාර අධ්‍යයන ජාතික සහතිකය ... ... | සිංහල ... | සන්ධ්‍යා ... | (1) ලඝු ලේඛනය |

**වාණිජ සිංහල දිවා**

| | | | |
|---|---|---|---|
| ව්‍යාපාර අධ්‍යයන ජාතික සහතිකය ... ... | සිංහල ... | සන්ධ්‍යා ... | (1) සිංහල භාෂාව<br>(2) වාණිජ ගණිතය<br>(3) සමාජ අධ්‍යයනය<br>(4) පිරිවැය ක්‍රම<br>(5) නීතිය පිළිබඳ සාමාන්‍ය මූලධර්ම<br>(6) විකුණුම් ශාස්ත්‍රය සහ විකුණුම් පාලනය<br>(7) ලඝුලේඛනය |
| ලඝුලේඛන සහතික පත්‍රය ... ... | සිංහල ... | සන්ධ්‍යා ... | (1) ලඝුලේඛනය |
| උසස් ලඝුලේඛනය ... ... ... | සිංහල ... | සන්ධ්‍යා ... | (1) ලඝුලේඛනය |
| විකුණුම් ශාස්ත්‍රය සහ විකුණුම් පාලනය ... | සිංහල ... | සන්ධ්‍යා ... | (1) විකුණුම් ශාස්ත්‍රය සහ විකුණුම් පාලනය |

**කර්මාන්ත ශාලා අංශය**

| | | | |
|---|---|---|---|
| යන්ත්‍රනය I ... ... ... | සිංහල ... | සන්ධ්‍යා ... | (1) ප්‍රායෝගික<br>(2) න්‍යාය<br>(3) කාර්මික ඇඳීම |
| යන්ත්‍රනය II ... ... ... | සිංහල ... | සන්ධ්‍යා ... | (1) ප්‍රායෝගික<br>(2) න්‍යාය<br>(3) කාර්මික ඇඳීම |
| යන්ත්‍රනය III ... ... ... | සිංහල ... | සන්ධ්‍යා ... | (1) ප්‍රායෝගික<br>(2) න්‍යාය<br>(3) කාර්මික ඇඳීම |
| හේත්තු වැද්දීම I ... ... ... | සිංහල ... | සන්ධ්‍යා ... | (1) ප්‍රායෝගික<br>(2) න්‍යාය හා ගණනය<br>(3) කාර්මික ඇඳීම |

| පාඨ මාලාව | මාධ්‍යය | දිවා/සන්ධ්‍යා | විෂයයන් |
|---|---|---|---|
| ෆේත්තු වැද්දීම II | සිංහල | සන්ධ්‍යා | (1) ප්‍රායෝගික<br>(2) න්‍යාය හා ගණනය<br>(3) කාර්මික ඇඳීම |
| ෆේත්තු වැද්දීම III | සිංහල | සන්ධ්‍යා | (1) ප්‍රායෝගික<br>(2) න්‍යාය හා ගණනය<br>(3) කාර්මික ඇඳීම |
| වෙල්ඩිං පාඨමාලාව | සිංහල | අර්ධදිවා | (1) ප්‍රායෝගික<br>(2) න්‍යාය හා ගණනය<br>(3) කාර්මික ඇඳීම |
| යන්ත්‍රනය I | සිංහල | දිවා | (1) න්‍යාය හා ගණනය<br>(2) ප්‍රායෝගික |
| ෆේත්තු වැද්දීම I | සිංහල | දිවා | (1) ප්‍රායෝගික |

**ලී වැඩ අංශය**

| පාඨ මාලාව | මාධ්‍යය | දිවා/සන්ධ්‍යා | විෂයයන් |
|---|---|---|---|
| වඩු සටහන් ඇඳීම | සිංහල | සන්ධ්‍යා | (1) කාර්මික චිත්‍ර ඇඳීම |
| වඩු සටහන් ඇඳීම II | සිංහල | සන්ධ්‍යා | (1) වඩු සටහන් ඇඳීම |
| ගෘහභාණ්ඩ සෑදීම | සිංහල | සන්ධ්‍යා | (1) ප්‍රායෝගික<br>(2) න්‍යාය<br>(3) කාර්මික චිත්‍ර ඇඳීම |
| කොන්ක්‍රීට් හැඩයම් පෙට්ටි තැනීම | සිංහල | සන්ධ්‍යා | (1) න්‍යාය<br>(2) කාර්මික චිත්‍ර ඇඳීම |
| සංගීත භාණ්ඩ තැනීම | සිංහල | අර්ධකාලීන | (1) ප්‍රායෝගික |

**මෝටර් යාන්ත්‍රික අංශය**

| පාඨ මාලාව | මාධ්‍යය | දිවා/සන්ධ්‍යා | විෂයයන් |
|---|---|---|---|
| ස්වයංචල යන්ත්‍රනය I | සිංහල | සන්ධ්‍යා | (1) කාර්මික ඇඳීම<br>(2) සිංහල භාෂාව |
| ස්වයංචලන යන්ත්‍රනය II | සිංහල | දිවා | (1) ස්වයංචල යන්ත්‍රනය න්‍යාය<br>(2) ගණනය<br>(3) විදුලි උපකරණ |

**විදුලි අංශය**

| පාඨ මාලාව | මාධ්‍යය | දිවා/සන්ධ්‍යා | විෂයයන් |
|---|---|---|---|
| ගුවන්විදුලි සහ ඉලෙක්ට්‍රෝනික් I | සිංහල | දිවා | (1) ප්‍රායෝගික |
| ගුවන්විදුලි සහ ඉලෙක්ට්‍රෝනික් II | සිංහල | දිවා | (1) ප්‍රායෝගික |
| ගුවන්විදුලි සේවා කිරීම | සිංහල | සන්ධ්‍යා | (1) න්‍යාය<br>(2) ප්‍රායෝගික |
| විදුලි කම්බි සවිකිරීම | සිංහල | සන්ධ්‍යා | (1) න්‍යාය<br>(2) ප්‍රායෝගික |

**මුද්‍රණ අංශය**

| පාඨ මාලාව | මාධ්‍යය | දිවා/සන්ධ්‍යා | විෂයයන් |
|---|---|---|---|
| වර්ණ යෝජනය | සිංහල | සන්ධ්‍යා | (1) න්‍යාය හා ගණනය<br>(2) ප්‍රායෝගික |
| උන්නත මුද්‍රණය | සිංහල | සන්ධ්‍යා | (1) න්‍යාය හා ගණනය<br>(2) ප්‍රායෝගික |
| පොත් බැඳීම | සිංහල | සන්ධ්‍යා | (1) න්‍යාය හා ගණනය<br>(2) ප්‍රායෝගික |

**ගොඩනැගිලි අංශය**

| පාඨ මාලාව | මාධ්‍යය | දිවා/සන්ධ්‍යා | විෂයයන් |
|---|---|---|---|
| ගොඩනැගිලි වෘත්තිය I | සිංහල | අර්ධ කාලීන | (1) ගොඩනැගිලි න්‍යාය<br>(2) ගොඩනැගිලි ඇඳීම<br>(3) ගොඩනැගිලි ගණනය |
| ගොඩනැගිලි වෘත්තිය II | සිංහල | දිවා | (1) ගොඩනැගිලි න්‍යාය<br>(2) ගොඩනැගිලි ඇඳීම<br>(3) ගොඩනැගිලි ගණනය |
| ජලනල සවිකිරීම | සිංහල | සන්ධ්‍යා | (1) න්‍යාය<br>(2) ප්‍රායෝගික |
| පෙදරේරු වෘත්තීය ඇඳීම | සිංහල | දිවා | (1) ගොඩනැගිලි වෘත්තීය න්‍යාය<br>(2) ගොඩනැගිලි වෘත්තීය ඇඳීම |

**කාල.**—දිවා කාල පන්ති සතියේ දිනවල පෙ.ව. 8.00 සිට ප.ව. 5.00 දක්වා වෙන අතර සන්ධ්‍යා කාල පන්ති සතියේ දිනවල ප.ව. 5.00 සිට 7.15 දක්වා ද සෙනසුරාදා දිනවල ප.ව. 2.00 සිට 4.00 දක්වා ද පැවැත්වේ.

**ගාස්තු.**—බාහිර කථිකාචාර්යවරුන්ට කෙරෙන ගෙවීම් පැයකට රු. 2.50 සිට රු. 21.00 දක්වා වෙයි. තෝරාගත් අයදුම්කරුවන්ට භාණ්ඩාගාරයෙන් අනුමත කරන පාඨමාලා තත්ත්වය අනුවත්, ඔවුන්ගේ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් අනුවත්, ගෙවීම් කරනු ලැබේ. ඉගැන්වීමේ පුරුද්දක් ඇති අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

**සේවා කොන්දේසි.**—මෙම පත්වීම් කරනු ලබන්නේ 1974 ජනවාරි මස පටන් දෙසැම්බර් මාසයේ අවසානය දක්වා එක් අධ්‍යයන වර්ෂයකටය. එහෙත් මෙම පත්වීම් අධ්‍යයන වර්ෂය තුළ කවර වේලාවකදී වුවද හේතුන් නොදක්වා අවසන් කිරීමට පුළුවන.

බාහිර කථිකාචාර්යවරුන් වාරය පටන් ගැනීමට පෙර තමන්ට දෙනු ලබන නිර්දේශ පත්‍ර අධ්‍යයන වර්ෂය තුළදී සම්පූර්ණ කිරීට පිණිස යොදන්නට අදහස් කරන කාර්යය මාලාව දේශන පැවැත්වීමට පටන් ගැනීමට පෙර ඉදිරිපත් කළ යුතුය. එසේම අධ්‍යයන වර්ෂය තුළදී ඔවුන් පවත්වන දේශන සම්මත කරන ලද කාර්යය මාලාවට අනුව විය යුතුය.

වර්ෂයාවසාන පරීක්ෂණයට බාහිර පරීක්ෂකවරුන් පත් කෙරෙන අවස්ථාවලදී හැර අනිකුත් වාරවල පරීක්ෂණ හා වර්ෂයාවසාන පරීක්ෂණ වලදී තම තමන්ගේ පන්තිවල විෂයයන් කිසිම ගෙවීමක් නොලබා පරීක්ෂා කිරීමට බාහිර කථිකාචාර්යවරුන් එකඟ විය යුතුය.

**අයදුම් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත දක්වෙන ආදර්ශ ඉල්ලුම් පත්‍රය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍ර 1973.12.31 වැනි දිනට හෝ ඊට පෙර, විදුහල් පති, ලංකා කාර්මික විද්‍යාලය, කොළඹ 10 යන ලිපිනයට ලැබෙන ලෙස එවිය යුතුයි. ආදර්ශ අයදුම් පතට වෙනස් ව ඉදිරිපත් කෙරෙන අයදුම් පත්‍ර භාරගනු නොලැබේ. එක් එක් අංශයයන් සඳහා වෙන වෙන ම අයදුම් පත් ඉදිරිපත් කළ යුතුයි.

ඒ. ජේ. එස්. ගුනවර්ධන,
කොළඹ, ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1973 දෙසැම්බර් මස 05 වැනි දින,
කොළඹ, ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කාර්යාලය,
කොළඹ 7.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

1. අංශය :————.
2. සම්පූර්ණ නම :————.
3. වයස :————.
4. පුද්ගලික ලිපිනය (දුරකථන අංකයක් ඇතොත් එය සඳහන් කරන්න) :————.
5. ව්‍යාපාර ලිපිනය (දුරකථන අංකයක් ඇතොත් එය සඳහන් කරන්න) :————.
6. වෘත්තිය හෝ රක්ෂාව :————.
7. වෙනත් රැකියා ඇත්නම් ඒවා :————.
8. ශාස්ත්‍රීය සුදුසුකම් (දින සඳහන් කරන්න) :————.
9. ඉගැන්වීමේ පළපුරුද්ද :—
   (i) ලංකා කාර්මික විද්‍යාලයේ :————.
   (ii) අනිකුත් ආයතනවල :————.
10. ප්‍රායෝගික සුදුසුකම් ඇත්නම් ඒවා :————.
11. බාහිර කථිකාචාර්ය/උපදේශක වශයෙන් ඉගැන්වීමට බලාපොරොත්තු වන විෂයයන් :—

| පාඨමාලාව | විෂයයන් | මාධ්‍යය |
|---|---|---|
| .............................. | .............................. | .............................. |
| .............................. | .............................. | .............................. |
| .............................. | .............................. | .............................. |

12. සතියක් තුළදී කළ හැකි උපරිම දේශන ගණන :————.
13. ඔබ රජයේ සේවකයෙක් ද යන වග :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

12-830—73.12.21 දින අංක 91 දරණ ගැසට් පත්‍රය

---

### නිවැරදි කිරීම

ලංකා ප්‍රමිති කාර්යාංශය

1973. 11. 30 දින හා අංක 88 දරණ ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ 1682 පිටුවේ පළවූ සැලසුම්කරු පිළිබඳ දැන්වීමෙ වැටුප් ක්‍රමය පහත සඳහන් අයුරින් සංශෝධනය විය යුතුයි:—

" රු. 380—රු. 20 × 6—රු. 500 (සියල්ල අඩංගු මාසික). "

12-1283—73.12.21 දින අංක 91 දරණ ගැසට් පත්‍රය

---

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

සිංහල ගුරු විභාගය—'බී' කොටස 1973

ඉහත නම් සඳහන් විභාගය අම්බලන්ගොඩ, අනුරාධපුරය, බදුල්ල, බණ්ඩාරවෙල, මඩකලපුව, කොළඹ, දඹුල්ල, දික්වැල්ල, ඇහැළියගොඩ, ගල්ගමුව, ගාල්ල, හෝමාගම, හොරණ, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුලියාපිටිය, කුරුණෑගල, මාතලේ, මාතර, මොණරාගල, නාවලපිටිය, නිකවැරටිය, මීගමුව, නුවරඑළිය, පේදුරුතුඩුව, පොළොන්නරුව, රත්නපුරය, ත්‍රිකුණාමලය, වවුනියාව සහ වේයන්ගොඩ යන මධ්‍යස්ථානයන්හි පවත්වනු ලබන අතර විභාගය ආරම්භ කරනුයේ 1974 පෙබරවාරි 23 වනදාය.

2. **සුදුසුකම්.**—මෙම විභාගයට ඉදිරිපත් විය හැක්කේ සිංහල ගුරු විභාගයේ 'ඒ' කොටසින් දැනට සමත් වී ඇති හෝ නිදහස් කර ඇති ගුරුවරුනට පමණි. එනකුදු වුවත් 1968 වැටුප් විෂමතා කමිටුවේ නිර්දේශයන් අනුව කාර්යක්ෂමතා කඩඉමකින් උසස් වීම සඳහා මෙම විභාගයෙන් සාමාර්ථ්‍යය ලැබිය යුතු ගුරුවරුනට ඉහත සඳහන් 'ඒ' කොටසින් සමත් වීමක් හෝ නිදහස් කරනු ලැබීමක් නැතිව මේ විභාගයට ඉදිරිපත් විය හැකිය.

3. **අයදුම්පත්.**—(i) මේ සමග ඇති ආදර්ශ ආකෘතිය අනුවම අඟල් 8 × 13 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තේ පිටපත් කර (ටයිප් කර පිළියෙල කරගන්නේ නම් ඉතා මැනවි) අයදුම්පත පිළියෙල කර ගත යුතුය.

(ii) සම්පූර්ණ කරන ලද අයදුම්පත් 1974.01.18 දිනට පෙර විභාග කොමසාරිස්, විභාග දෙපාර්තමේන්තුව, මැලේ වීදිය, කොළඹ 2 යන ලිපිනයට ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතු අතර, විභාග කොමසාරිස්ගේ හෝ අන්‍ය නිලධාරියකුගේ පෞද්ගලික නමට එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම් පත්‍රය බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවර විභාගයේ නම සඳහන් කරන්න.

(iii) කාර්යක්ෂමතා කඩඉම්කින් සමත් වීම සම්බන්ධයෙන් මෙම විභාගයට අයදුම්පත් එවන ගුරුවරුන් ස්වකීය අයදුම්පත් අදාල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ/ප්‍රධාන අධ්‍යාපන නිලධාරි තැන මගින් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට ප්‍රථම අයදුම්පත් විභාග කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීමට හැකි වන සේ කල්වේලා ඇතිව තම අයදුම්පත් ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ/ප්‍රධාන අධ්‍යාපන නිලධාරි තැන වෙත ඉදිරිපත් කිරීමට මෙම ගුරුවරුන් වග බලාගත යුතු අතර අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට ප්‍රථම එම අයදුම්පත් විභාග දෙපාර්තමේන්තුවට ලැබෙන සේ එවීමට ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ/ප්‍රධාන අධ්‍යාපන නිලධාරිවරුන් කටයුතු කළ යුතුය.

(iv) ගැසට් පත්‍රයේ ආකෘතියට සම නොවන ලෙස අයදුම්කරුවන්ට වුවමනා අන්දමට පිළියෙල කොට එවන අයදුම්පත් හා අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

සැ. යු.—1973.10.13 දින පැවැත්වීමට නියමිතව තිබුණ විභාගය සම්බන්ධයෙන් 1973.08.24 දිනය සහ අංක 74 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වූ නිවේදනයට අනුව මෙම විභාගයට අයදුම්පත් එවා ඇති අයදුම්කරුවන් මෙම නිවේදනය අනුව නැවත අයදුම්පත් එවිය යුතු නොවේ.

4. අයදුම්පත් විභාග කොමසාරිස් වෙත එවීමට ප්‍රථම 1969 ඔක්තෝබර් හා ඉන් පසු පවත්වනු ලබන සිංහල ගුරු විභාග සඳහා සංශෝධිත සිංහල ගුරු විභාග ව්‍යවස්ථා හා නිර්දේශ පත්‍රය කියවා මනා අවබෝධයක් ලබා ගන්නා ලෙස අයදුම්කරුවන්ට දන්වනු ලැබේ. මෙම ව්‍යවස්ථා හා නිර්දේශ පත්‍රය ආණ්ඩුවේ පොත් ආයතනයෙන් සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ තොරතුරු මධ්‍යස්ථානයෙන් ශත 40 ක් ගෙවා මිලදී ලබා ගත හැකිය. තැපෑලෙන් අවශ්‍ය අයට රුපියල් 1.25 ක මනිඕඩරයක් හෝ පෝස්ටල් ඕඩරයක් විභාග කොමසාරිස් නමට එවීමෙන් ලබා ගත හැකිය.

5. ඉහත 4 වන ඡේදයේ සඳහන් ව්‍යවස්ථාවල කෙසේ සඳහන්ව තිබුණත් මෙම විභාගය සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු බලපානු ඇත :—

(i) දැන් පවත්වනු ලබන්නේ සිංහල ගුරු විභාගයේ ‘බී’ කොටසේ පරීක්ෂණය පමණි.

(ii) ව්‍යවස්ථා මාලාවේ 6 සිට 10 දක්වා ඡේදවල දක්වා ඇති සිංහල ගුරු විභාගයේ ‘ඒ’ කොටසින් නිදහස් කිරීම පිළිබඳව දී ඇති සියළු අනුග්‍රහ නවත්වා ඇත. 5 වන ඡේදයේ සඳහන් පරිදි හැර ‘ඒ’ කොටසින් නිදහස් කිරීම පිළිබඳව සලකා බලනු නොලැබේ.

(iii) මෙම විභාගයේ ප්‍රතිඵල ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබේ.

(iv) සමත් වූ අයදුම්කරුවන් සම්බන්ධයෙන් සහතිකපත් දීමක් නොකෙරෙනු ඇත.

(v) අයදුම්පත්වල අත්සන සහතික කිරීම අයදුම්කරු ඉගැන්වීම කරන පාසලේ ප්‍රධානයා ලවා කරවා ගත යුතුය.

මෙම විභාගය සඳහා විභාග ගාස්තුව රු. 20 කි.

බෝගොඩ ප්‍රේමරත්න,
විභාග කොමසාරිස්.

1973 දෙසැම්බර් 10 දින,
විභාග දෙපාර්තමේන්තුව,
මැලේ වීදිය, කොළඹ 2.

### ආදර්ශ අයදුම් පත

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### 1973 සිංහල ගුරු විභාගය ‘බී’ කොටස සඳහා අයදුම් පත්‍රය

1. අයදුම්කරුගේ පුරුදු අත්සන :————.

විභාග අංකය :————.
(කාර්යාලයේ ප්‍රයෝජනය සඳහායි)
ස්ත්‍රී පුරුෂ භාවය :————.

2. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(පූජ්‍යවරයෙක් හෝ මෙනවියක් හෝ මහත්මියක් හෝ නම් ඒ බව සඳහන් කරන්න. ගුරුවරයෙකු වශයෙන් පත්වීමේ දී ව්‍යවහාර කළ නම් නැතහොත් උප්පැන්න සහතිකයේ සඳහන් නම ලියන්න.)

3. ප්‍රවේශ පත්‍ර හෝ වෙනත් ලියවිලි එවිය යුතු ලිපිනය :————.

4. මධ්‍යස්ථානය (වඩාත්ම කැමති මධ්‍යස්ථානය පළමුවත් අනික් වා ඊට යටිනුත් ලියන්න) ස්ථාන තුන ගැසට් නිවේදනයේ පළමුවැනි ඡේදයේ දැක්වෙන මධ්‍යස්ථානයන් අතරින් තෝරා ගත යුතු අතර ඒවා එකිනෙකට වෙනස් විය යුතුයි.)

1. ————.
2. ————.
3. ————.

5. විභාග ගාස්තු සඳහා අවශ්‍ය මුද්දර මෙහි අලවන්න.
(විභාග ගාස්තුව රු. 20.00කි.)

> මුද්දර අලවන කොටුව මේ මුද්දර අයදුම්කරුගේ අත්සන හා දිනය යොදා අවලංගු කර සහතික කළ යුතුය. මුද්දර එකපිට එක නො සිටිනසේ ඇලවිය යුතුය.

6. 1973 ජනවාරි 01 වැනි දිනට වයස :————.

7. දැනට ලබා ඇති පත්වීම පිළිබඳ විස්තර :————.

(අ) පාසැල, එහි ලිපිනය හා එය රජයේද/උපකෘත/අනුමත කළ ආධාර නොලබන පෞද්ගලිකද/අනුමත පිරිවෙණක්ද යන වග :————.
(ආ) තත්ත්වය (සථිරද/ආධුනිකද) :————.
(ඉ) දැනට දරණ පත්වීම සහතික ලත්/සහතික නොලත් (උපගුරු :————.
(ඊ) අයදුම්කරු විසින් උගන්වනු ලබන විෂයයන් :————.
(උ) අයදුම්කරු විසින් උගන්වනු ලබන මාධ්‍යය :————.
(ඌ) සතියකට උගන්වන පැය ගණන :————.
(එ) ලැබෙන මාසික වැටුප (ඒකාබද්ධ) දැනට ලැබෙන වැටුප හා වැටුප් ක්‍රමය :————.
(ඒ) ගුරු විභාගයේ ‘බී’ සහ ‘සී’ කොටස්වලින් සමර්ථ විය යුතු කාර්යක්ෂමතා කඩඉම් වැටුප් ක්‍රමයේ තිබේද ? :————.

එසේ නම් එම වැටුප් පියවර :————.

8. ගුරුවරයාගේ ලියා පදිංචි කළ අංකය හෝ එම පත්වීම පිළිබඳ නිකුත් කරන ලද ලියමනේ අංකය හෝ අධ්‍යාපන අධ්‍යක්ෂ තැන හෝ ප්‍රාදේශීය අධ්‍යාපන නිලධාරි තැන විසින් පත්වීම අනුමත කිරීම පිළිබඳ ලියමනේ හෝ විස්තර මෙහි සඳහන් කළ යුතුය :————.

9. පාසැලේ කළමනාකාර තැන විසින් හෝ පාසැල් ප්‍රධානියා විසින් හෝ මේ කොටස පිරවිය යුතුය.

මෙම අයදුම්කරු පිළිබඳ ලිපි ලේඛනාදිය මා පරීක්ෂා කළ බවත්, එම ලිපි ලේඛනාදිය අනුව මෙම අයදුම්පතෙහි 2 වැනි, 6 වැනි, 7 වැනි හා 8 වැනි කොටුවල ලියා ඇති කරුණු නිවැරදි බවත් සහතික කරමි.

පාසැලේ නම :————.
එහි වර්ගය :————.
රජයේ පාසැලක්ද/උපකෘත පාසැලක්/අනුමත කළ ආධාර නොලබන පෞද්ගලික පාසැලක්ද/ අනුමත පිරිවෙණක්ද ?

නම :————.
ලිපිනය :————.
අත්සන :————.
දිනය :————.

10. අයදුම්කරුගේ සහතිකය :

මේ අයදුම් පතෙහි ලියන ලද කරුණු සැබෑ බවට මම සහතික කරමි. මෙහි අලවා තිබෙන මුද්දර මා විසින් ඇලවූ බවත්, ඒවා මීට ඉහතින් පාවිච්චි නොකළා වූද දැනට වලංගු වූ හොඳ මුද්දර බවත් මෙයින් සහතික කරමි. තවද විභාග කොමසාරිස් විසින් ප්‍රසිද්ධ කරන ලද මේ විභාගය පිළිබඳ ව්‍යවස්ථාවලට හා අයදුම්කරුවන් විසින් විභාග ශාලාවේ දී පිළිපැදිය යුතු අණපනත් වලටත් එකඟව ඉන් බැඳී සිටීමට ද මෙයින් පොරොන්දු වෙමි.

දිනය :———— ————,
අයදුම්කරුගේ අත්සන.

11. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (සෑම අයදුම්කරුවෙකුම සඳහා) : ........................................................ වන මම ඉහත සඳහන් අයදුම්කරු ........................................................ මාගේ පාසැලේ ගුරුවරයෙකු බවද 197 .................... මස ......... වැනි දින මා ඉදිරියෙහි අත්සන් තබන ලද බවද සහතික කරමි.

පාසැල් ප්‍රධානයාගේ නම :————.
පාසැල් ප්‍රධානයාගේ අත්සන :————.
පාසැලේ ලිපිනය :————.

දිනය :————.

* 12. ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ/ප්‍රධාන අධ්‍යාපන නිලධාරිගේ සහතිකය :

සහතික ලත්/සහතික නොලත් ගුරු තනතුරක් දරණ ඉහත නම් සඳහන් අපේක්ෂකයාට තම වැටුප් ක්‍රමයේ ඇති කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම සඳහා ගුරු විභාගයේ ‘බී’ සහ ‘සී’ කොටස් වලින් සමත් විය යුතු බව සහතික කරමි. ————,
ප්‍රා.අ.අ./ප්‍රා.අ.නි.

දිනය :————.

*(දැන්වීමෙහි 3 (iii) ඡේදයෙහි සඳහන් අයදුම්කරුවන් සම්බන්ධයෙන් පමණි.)

### විභාගාපේක්ෂකයන් සඳහා උපදෙස්

විභාගාපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් මිනිත්තු 10 කට හෝ 15 කට වත් කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරි හැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත් වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැලකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නො කිරීම එම විෂයය හෝ විෂය යන් සම්බන්ධයෙන්, තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතුවිය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අනන්‍යතා පත්‍ර (හැඳින්වීමේ පත්‍ර) ඉදිරිපත් කළ යුතු අපේක්ෂකයන් සෑම විෂයයකට ම පෙනී සිටිනවිට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි, විභාග ශාලාවේ දී ඉදිරිපත් නො කළහොත් ඔබේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්ට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සලසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම් :—ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ප්‍රස්තාර කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි ආදිය) සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණොත් ඒ බව නොපමාවම විභාගශාලාධිපතිට දැන්විය යුතුය. විභාගශාලාවේදී ඔබටම දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නො කළ යුතුයි. ඉතිරිවන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වනසේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝු ගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරෙස්සමෙන් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුයි.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන රබර් කෑලි, අඩි කෝදු, ජ්‍යාමිති උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියක ම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නො පමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේ ම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක් කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලීවාට පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන හැම දෙයක් ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නො විය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිය යුතුයි තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයකට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුයි.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද තෝරාගත යුතු අන් ප්‍රශ්නද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමෙන් කියවා බැලිය යුතුයි. මෙය නො සලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදු විය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගණන් බැලීම සහ කටු වැඩ ඒ ඒ ගණන සෑදීමේ කොටසක් වශයෙන්, අනු ක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමු කර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන නැවත නැවතත් ඇඳ පෙන්වීම යොග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ල ම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කෑබැල්ලෙන් නො ගැලවී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍ර විභාගශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ සියතින් ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේ ම වාඩි වී සිටිය යුතුය. මෙසේ නො කිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිව යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නො වූවකුසේ සලකනු ලැබීමටද හේතුවිය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙන යම් සේවකයකුට හෝ භාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ කථා කිරීම අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම අසනයෙන් නො නැගිට අත පමණක් එසවිය යුතුය.

බෝගොඩ ප්‍රේමරත්න,
විභාග කොමසාරිස්.

කොළඹ 2, මැලේ වීදියේ,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේදිය.

12-718—73.12.21 දින අංක 91 දරණ ගැසට් පත්‍රය

---

### අධ්‍යාපන අමාත්‍යාංශය—ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලය, කොළඹ 10

#### පාඨමාලාවලට ඇතුළත්වීම—1974 අධ්‍යයන වර්ෂය

මරදාන ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ පහත සඳහන් අධ්‍යයන පාඨමාලාවලට ඇතුළත්වීම සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ :—

| | පාඨමාලාව | මාධ්‍ය | කාලපරිච්ඡේදය | කාලය |
|---|---|---|---|---|
| 1. | උසස් ජාතික වාණිජ ඩිප්ලෝමා පාඨමාලාව | ඉංග්‍රීසි | අවුරුදු 4 | පූර්ණ දිවා කාල |
| 2. | උසස් ජාතික තක්සේරු ඩිප්ලෝමා පාඨමාලාව | ඉංග්‍රීසි/සිංහල | අවුරුදු 4 | 1 සහ 2 වන අවුරුදු පූර්ණ දිවා කාල<br>3 සහ 4 වන අවුරුදු සන්ධ්‍යා කාල |
| 3. | උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා | ඉංග්‍රීසි | අවුරුදු 4 | සන්ධ්‍යා |
| 4. | ලේකම් ශාස්ත්‍රය | ඉංග්‍රීසි | අවුරුදු 4 | පූර්ණ දිවා කාල |
| 5. | ලේකම් ශාස්ත්‍රය | ඉංග්‍රීසි | අවුරුදු 4 | සන්ධ්‍යා කාල |
| 6. | බැංකු ක්‍රමය පිළිබඳ පාඨමාලාව | ඉංග්‍රීසි | අවුරුදු 3 | සන්ධ්‍යා කාල |
| 7. | ප්‍රවාහන පිළිබඳ පාඨමාලාව | ඉංග්‍රීසි | අවුරුදු 4 | සන්ධ්‍යා කාල |
| 8. | ලඝු ලේඛක උසස් පාඨමාලාව | ඉංග්‍රීසි/සිංහල | අවුරුදු 1 | සන්ධ්‍යා කාල |
| 9. | වඩුවැඩ හා පිරිද්දුම් වැඩ | සිංහල | අවුරුදු 2 | පූර්ණ දිවා කාල |
| 10. | ගොඩනැගිලි වෘත්තිය | සිංහල | අවුරුදු 2 | පූර්ණ දිවා කාල |
| 11. | වෑල්ඩිං පාඨමාලාව | සිංහල | 6 මාසික | අර්ධ දිවා කාල |

2. ඉහත සඳහන් පාඨමාලා අංක 3, 5, 6, 7 සහ 8 පාඨමාලාවන්ට සම්බන්ධිත රක්ෂාවන්හි යෙදී ඇති අයවළුන්ගෙන් ලැබෙන ඉල්ලුම් පත්‍ර පමණක් සැලකිල්ලට ගනු ලබන අතර, ඊට අදාල ඉල්ලුම් පත් සේවා යෝජකයා මගින් ඉදිරිපත් කළ යුතුය. සේවා යෝජකයා විසින් ඉල්ලුම් පත් නිර්දේශ කිරීමේදී අයදුම්කරුවන්ගේ සේවයේ ස්වභාවය පැහැදිලිව සඳහන් කළ යුතුය. ඉහත සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ඉල්ලුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

3. ඉල්ලුම් පත් ගාස්තු එක් අවුරුද්දකට වඩා වැඩි අඩු පාඨමාලාවන් සඳහා රු. 1 ක් ද, අනෙක් පාඨමාලාවන් සඳහා රු. 2 ක් ද වන්නේය. මෙම වටිනාකම්වලට ඉල්ලුම් පත්‍රයෙහි මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන යොදා විධිමත් පරිදි ඒවා අවලංගු කළ යුතුය.

4. යෝග්‍යතා කොන්දේසි ඇතුළුව සියළුම පාඨමාලාවන් පිළිබඳ සම්පූර්ණ විස්තර ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ වාණිජ සහ වෘත්තීය අත්පොත්වල සඳහන්ව ඇත. ඒවා කොළඹ 1, මහ ලේකම් කාර්යාලයේ ප්‍රකාශණ අංශයෙන් ලබා ගත හැක. ඉල්ලුම් පත් සම්පූර්ණ කිරීමට පෙර මෙම අත්පොත් කියවා බලන ලෙස අපේක්ෂකයින් වෙත තරයෙන් මින් දැනුම් දෙමි.

5. සියළුම ඉල්ලුම් පත්‍ර කොළඹ 10, ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ ලේඛකාධිකාරී වෙත 1974.01.12 වැනි දිනට හෝ ඊට පෙර ඔහුට ලැබෙන ලෙස ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් පත් ආදර්ශය පහත සඳහන් වේ.

6. අඩුවෙන් මුද්දර ඇලවූ හෝ අසම්පූර්ණ හෝ නියමිත ආකෘති පත්‍රයෙහි නිසි ලෙස පුරවා නොමැති හෝ ප්‍රමාද වී ලැබුන හෝ සියළුම ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ. එක් එක් පාඨමාලාවන් සඳහා වෙන් වශයෙන් ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

7. අර්ධ කාලීන සියළුම පාඨමාලා හදරනු ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් ගෙන් පහත දක්වා ඇති පරිදි මාසික ගාස්තු අය කරනු ලබන බව දන්වමි :—

1. වෘත්තීය හා ඩිප්ලෝමා පාඨමාලා සඳහා මසකට රු. 15.00 බැගින්,
2. කාර්මික මට්ටමේ පාඨමාලාවන් සඳහා මසකට රු. 10.00 බැගින්,
3. ශිල්පීය මට්ටමේ පාඨමාලා සඳහා මසකට රු. 5.00 බැගින්.

ටී. ඩ. පී. ප්‍රනාන්දු,
අධ්‍යාපන අධ්‍යක්ෂ (කාර්මික අධ්‍යාපනය),
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

1973 දෙසැම්බර් මස 11 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේදීය.

**(ආදර්ශ ඉල්ලුම් පත්‍රය 12″ × 8″)**

ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලය—අධ්‍යයන වර්ෂය 1974

**(සැ.යු. මෙම අයදුම් පත සම්පූර්ණ කොට කොළඹ 10, ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ ලේඛකාධිකාරී වෙත කෙලින්ම එවිය යුතුය.)**

1. පාඨමාලාව :————. දිවා/සන්ධ්‍යා/අර්ධ දිවා
2. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.
3. මුළකුරු සමඟ නම :————.
4. (අ) උපන් දිනය :————.
   (ආ) 1974.01.01 ට වයස :— අවුරුදු :————. මාස :————. දින :————.
5. ජාතිය :————.
6. ස්ත්‍රී පුරුෂ භාවය :————.
7. පුද්ගලික ලිපිනය :————.
8. රාජකාරී ලිපිනය :————.
9. සාමාර්ථය ලත් විභාග (වර්ෂය සහ මාසය සඳහන් කරන්න) විෂයයන් සහ ප්‍රවීනතා සහිතව :————.
10. අයදුම්කරුගේ රක්ෂාව කුමක්ද, එය කවරෙකු යටතේද යන වග සමඟ ඔහුගේ ලිපිනය, රැකියාවේ ස්වභාවය පිළිබඳ සම්පූර්ණ විස්තරයද සැපයිය යුතුය :————.
11. පියාගේ/භාරකාරයාගේ නම, ලිපිනය සහ රක්ෂාව :————.

මෙහි ඉහත සඳහන් කරුණු සැබෑ බවට සහතික කරමි.

මුද්දර

දිනය :————.

————.
අයදුම්කරුගේ අත්සන.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළකරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනයට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාර ගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළයුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම යැවිය යුතුය.

සැ. ය.—මුදල් ගෙවා ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න

උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| දෙසැම්බර් | 73.11.16 | සිකුරාද | ... | 73.11.07 | බදාදා | දවල් 12.00 |
| | 73.12.14 | සිකුරාද | ... | 73.12.05 | බදාදා | දවල් 12.00 |
| | 73.12.21 | සිකුරාද | ... | 73.12.12 | බදාදා | දවල් 12.00 |
| | 73.12.28 | සිකුරාද | ... | 73.12.19 | බදාදා | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා ජනරජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව